# සයුරෙන් එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
ISSN 1391 5145
2022 පෙබරවාරි


## 74 වන නිදහස් දිනය අභිමානයෙන් සමරමු.



ඡායාරූපය අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී.

නිදහස් දිනය නිමිත්තෙනි.

# සිංහල රාජවංශයේ අවසානය



විදේශ ආක්‍රමනිකත්වයට රට ගොදුරු වූයේ වෙළදාම මූලික වීමෙනි. වෙළඳ කටයුතු සඳහා ආසියාවට පැමිණි බටහිරයන් පළමුව වෙළඳාම හා අපනයන භාණ්ඩ රැස්කළ අතර අනතුරුව සිය ආගම ව්‍යාප්ත කිරීම ඇරැඹූහ. ඒ සඳහා ඔවුනුත් විවිධ සටකපට ක්‍රියා අනුගමනය කළහ. එම කාල පරාසවල රටේ රාජ්‍යය විචාල ඒ ඒ රජවරුන් ගේ දක්ෂතා දුර්වලතා වලට අනුකූලව ආක්‍රමණිකයා දුර්වලවීමත් බලවත්වීමත් සිදු විය. ක්‍රි. ව. 1705 වසර ලංකාවට විශේෂ වූයේ එවකට කන්ද උඩරට පාලනය කළේ දෙවන විමලධර්මසූරිය රජු නිසාය.

ලන්දේසි ජාතික ගොන්සල්වේස් කතෝලික පාදිලිවරයා රට තුළ කතෝලික ආගම ව්‍යාප්ත කිරීමේ දැඩි වෙහෙසක නිරත වූ අයෙකි. ඒ සඳහා ඔහු විවිධ සටකපට කම් ද කළේය. ඔහු කෙසේ හෝ දෙවන විමලධර්ම සූරිය රජුගේ සිත දිනාගත් අතර රජුගේ කුලූපග මිත්‍රයෙකු බවට පත්විය. ඒ අනුසාරයෙන් රජුට තව තවත් පාදිලිවරුන් හඳුනා ගැනීමට හැකි විය. කන්ද උඩරටම කතෝලික ආගම ව්‍යාප්ත වීමේ ආරම්භය සනිටුහන් වන්නේ එතනිනි.

ක්‍රි.ව. 1707 දී දෙවන විමලධර්මසූරිය රජු මිය යෑමත් සමඟ උඩරට රජු බවට පත්වන්නේ ඔහුගේ පුත් කුණ්ඩසාලේ කුමාරයා නමින් හැඳින්වූ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය.

මෙම කාලය වන විට ලංකාවේ බුදු දහම උපරිම මට්ටමින් පිරිහෙමින් තිබුණ යුගයක් වූ අතර උපසම්පදා භික්ෂූන් වහන්සේලා රට නොසිටි අතර ගණින්නාන්සේලා නැමැති පස්කම් සැප විඳින ගොවිතැන්බත් කරන අඹුදරුවන් පෝෂණය කරන පිරිසක් පන්සල් ආශ්‍රිතව සිටියහ. නරේන්ද්‍රසිංහ අකුරු කළේ සූරියගොඩ ජයසුන්දර ගුරුන්නාන්සේ ගෙන් වූ අතර මෙම රජුට බුදු දහම පිළිබඳ එතරම් අවබෝධයක් නොතිබුණි.



රජුටද ජනතාවට රට ජාතිය පිළිබඳ එතරම් කැක්කුමක් නොවූ අතර ජනතාවට සුබ සිද්ධිය ඇති කිරීමට ඔහු උනන්දු නොවීය. විනෝදකාමී රජෙකු වූ අතර දැඩි ස්ත්‍රී ලෝලීත්වයට නතුවූවෙකි. අවසාන වසර කීපයේදී පියා කටයුතු කළ ආකාරයෙන් ගොන්සාල්වේස් පාදිලිවරයා ඔහුගේ උපදේශකවරයා ලෙස කටයුතු කළේය. මේ හේතුව නිසා කතෝලික පාදිලිවරුන් රජ ගෙදර නිදහසේ සැරි සැරූහ. සූරියගොඩ ගණින්නාන්සේට පවා රජුගේ තිබූ ගෞරවය දුරස්විය.

ලද බොළඳ සල්ලාල විනෝදකාමී රාජ දිවියක් ගෙවූ මොහු ලන්දේසීන්ගේ විස්කි බ්‍රැන්ඩි වැනි මත්පැන් පානය සඳහා ද ඇබ්බැහි විය. ලන්දේසීන් රජුට විවිධ කාන්තාවන් සැපයීමද සිදු කළේය. දකුණු ඉන්දියාවෙන් නායක්කාර් වංශික කාන්තාවන් ගෙන්වීම ආරම්භ කළේ මේ නරපතියා විසිනි. වඩුග දෙමළෙකුට මහ ඇමතිකම දෙමින් සිංහල රජ වංශය කෙළසමින් කටයුතු කළ මොහු රට ජාතිය පාවා දෙමින් සිංහල ජාතියේ බුදු දහමේ උන්නතිය විනාශ කිරීමේ ආරම්භකයා බවට පත්විය.

**1815 පෙබරවාරි මාසයේ රජු රජ මාලිගයෙන් පළාගොස් මැද මහනුවර පල්ලෑහැවත්තේ පිහිටි බෝමුරේ ආරච්චිගේ නිවසේ සැඟවිය. එක්නැලිගොඩ නිලමේ දොළොස්වන මොහොට්ටාල මහවලතැන්නේ මොහොට්ටාල ආදී පිරිස් ඉංග්‍රීසි බල ඇණියක් සමග රජු අල්ලා ගත්තේය. 1815 පෙබරවාරි 18 වන දින රජු අල්ලා ගැනීමත් සමග වසර 2358 ක සිංහලේ සිහසුන ඉංග්‍රීසි කිරීටය යටතට පත්විය.**

දකුණු ඉන්දියාවෙන් බිසවුන් ආනයනය කරන විට ඔවුන්ගේ නෑදෑ සමූහයාද ශිව ආගමද දෙවිවරුද විවිධ ඇදහිලිද මෙරටට සංක්‍රමනය විය. පන්සල තුළ කෝවිල්ද ඉදිවිය. දළඳා පෙරහරට දකුණු ඉන්දියානු ආභාශය ඇති විය. මාළිගාව තුළ කතෝලික ආගම ව්‍යාප්ත විය. රජුගේ පාලනය දෙවසරක් යන විට ජනයාට එපා විය.

රජුට එරෙහිව රටපුරා ජනතා විරෝධයක් මතුවිය. රජුට එරෙහි කැරැල්ල මර්ධනයේදී සිංහල වැසියන් ඝාතනය විය. රජු හුන්නස්ගිරියට පැන ගියේය. පේදුරු දස්කොන් මහඅධිකාරම නිසා රජු බේරුනි. පසුව හඟුරන්කෙත මාලිගයක් ඉදිකරවාගන රජු එහි ජීවත් විය. මාලිගය අසලින්ම ගොන්සල්වේස් පාදිලි තැන නිවසක් හා පල්ලියක් ඉදිකර ගත්හ.

දිනෙන් දින රජුට සිංහලයින් ගැන ඇතිවූයේ පිළිකුලකි. රටපුරා පල්ලි හැදීම සඳහා රජුගේ අවසරය හිමි විය. මේ හේතු නිසා සිංහල බෞද්ධ ජනයා රජු හා තව තවත් උරණ වූහ. මෙම රජු සාහිත්‍යයට හා කියවීමට රුචිකත්වයක් දක් වූ බව කියයි. 1721 දී දස්කොන් අධිකරම රජු අතින් මැරුම් කෑහ. ඒ රජ බිසව හා ඇතිවූ පෙම් හබයක් හේතුවෙනි.

මේ අතර වැලිවිට සරණංකර හිමියන් සුසිල්වත් ගුණවත් හිමිනමක් වශයෙන් ජනතාව අතර ප්‍රකට විය. ඒ හිමියන් කෙරෙහි ජනතාවගේ ප්‍රසාදය වැඩිවීම රජුටත් ගණින්නාන්සේලාටත් කතෝලිකයින්ටත් මහත් හිරිහැරයක් විය. ඔවුන්ගේ කේලම් ඇසූ රජු සරණංකර හිමියන් කන්ද උඩරටින් පිටුවහල් කළේය.





රජුගේ ඊළඟ අභිප්‍රාය වූයේ තම රාජ්‍යත්වයෙන් පසු බිසවුන් වහන්සේගේ මලනුවන්ට ඊළඟ රජවිප්‍රාප්තිය ලබාදීමය. ඒ සඳහා අවශ්‍ය පසුබිම රජුවිසින් ගොඩනග න්නට විය.

සරණංකර හිමියන්ගේ සිල්වත්කම හා ජනතාව හිමියන් වටා එක් රැස්වීම පිළිබඳව කොළඹ කතෝලික මහ

3 වෙනි පිටුවට ....

2 වෙනි පිටුවෙන් ....

# සිංහල රාජවංශයේ අවසානය ...

පල්ලියටද දන ගන්න ලැබුණි. එයින් මහත් සේ උරණ වූ කතෝලික සභාව ඒ හිමියන් වසදී මරා දැමීම සඳහා කාබෙරින් හය දෙනෙකු මහනුවරට එවූහ. මොවුන් හය දෙනා මඩුගල්ලේ දිසාවට හසුවිය. මඩුගල්ලේ දිසාව රජුට කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව රජු මහත්සේ කිපී පාදිලියන් මහනුවරින් පිටුවහල් කළේය.

ඉන්පසු හිමිපාණන් නැවත නුවරට ගෙන්වා උන්වහන්සේට ආරක්ෂාව සපයා අධ්‍යයන හා ශාස්ත්‍රීය කටයුතුවලට රජතුමා අනුග්‍රහය දක්වූ බව කියයි.

රජුගේ මස්සිනා ඊළඟ රජ බවට පත්කරලීමේ කුමන්ත්‍රණය රජු මනාව දියත් කළේය. හිතවත් ඇමතිවරු මගින් මේ පිළිබඳව සරණංකර හිමියන්ටද දන්වීය. නායක්කාර් හාමුදුරුවෝ යන නමින් මොහු සරණංකර හිමියන් යටතේ කටයුතු කළහ. මස්සිනා රජ වූ පසු ඒ මගින් රට තුළ ඒ වන විට නැතිවී තිබූ උපසම්පදාව ගෙන්වා බුදු දහම ස්ථාපිත කිරීම හිමියන්ගේ අරමුණ වූවා විය හැක. දන හෝ නොදන උන්වහන්සේද නායක්කර් වංශිකයෙකුට රටේ රාජ්‍යත්වය ලබාදීමට කටයුතු කළහ.

ක්‍රි.ව. 1739 දී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු මිය යයි. ඔහු මෙරට සිහසුන දරූ අවසන් සිංහලයා විය. ඉන්පසු රජ වූ සියලූ දෙනා බුදු දහම වැළඳගෙන වුවත් නායක්කාර වංශිකයින් වූ අතර ඔවුන් දකුණු ඉන්දියානු වඩුග පරම්පරාවේ පිරිස් විය. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මිය යෑමෙන් ඔහුගේ මස්සිනා ශ්‍රී විජය රාජසිංහ නමින් සිහසුනට පත්විය.

මොහු ප්‍රථම වතාවට රාජ සභාවට දෙපිරිසක් කැඳවීය. එනම් සිංහල රදලවරු හා නායක්කාර වංශික පිරිස්ය. මේ දෙපිරිසම රාජ සභාවේ රාජ්‍ය පාලනයට එක්විය. තරමක් යටපත්ව සිටි නායක්කාර වංශිකයින් කලඑලි බැස්සේය. දකුණු ඉන්දියාවෙන් තව තවත් පිරිස් පැමිණ මහනුවර පැලපදියම් වූහ. ඔවුන් වැඩිපුර සිටි ප්‍රදේශය අද මලබාර් වීදිය නමින් ප්‍රකටය. එතෙක් පියාගෙන් පුතාට ආ රජ උරුමය මොහුගෙන් පසු අගබිසවගේ මල්ලීට ලබාදීමේ සම්ප්‍රදාය ඇතිවිය. රජු මලබාර කුමරියක් සරණපාවා ගත්තේය. ඒ තුලින් තව තවත් මෙරට රාජ්‍යත්වය දකුණු ඉන්දියානු සංස්කෘතියට නැඹුරු වන්නට විය.

සරණංකර හිමියන්ට රාජ ගුරු තනතුර පිරිනැමූ අතර කතෝලික පිරිස් බැහැර කළේය. භික්ෂූන්ට පක්ෂපාති ලෙන්ගතුකමක් ඔහු කෙරෙන් දක්නට විය. ක්‍රි.ව. 1747 දී රජු අභාවප්‍රාප්ත වූ අතර ඔහුගේ ඇවෑමෙන් සිහසුන බාර ගත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුය. ඔහු මුලින් කී විජය රාජසිංහ ගේ බිසවගේ සොහොයුරාය.

මේ රජු බුදු සමය වැළඳගත්තද ඔහු ශිව ආගම අත් නොහැරියේය. එතෙක් පැවති ශ්‍රීපාදස්ථානයේ පාලන බලය පූසාරින් ගෙන් ගලවා සරණංකර හිමියන් වෙත පැවරූ බව කියවෙයි. රජු ශිව ආගම අත් නොහැරීම තුළින් කන්ද උඩරට පාලනය ප්‍රකට හා බෞද්ධ මිශ්‍ර සංකර සංස්කෘතික ලක්ෂණ ඇතිවිය.

මේ නිසා කිපුණ රදළයින් රජුට එරෙහිව කුමන්ත්‍රණ කළ අතර එය දනගත් රජු කිපී සමරක්කොඩි සහ මොළදණ්ඩ නැමැති සිංහල නායකයින් මරා දැමුවේය. මෙම කුමන්ත්‍රණය රජුට හෙළිකර ඇත්තේ මරක්කල මුදලිවරයෙකි.

දේවාලවලට අයත්ව තිබූ පෙරහැරවලට

> **ක්‍රි.ව. 1739 දී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු මිය යයි. ඔහු මෙරට සිහසුන දැරූ අවසන් සිංහලයා විය. ඉන්පසු රජු වූ සියලූ දෙනා බුදු දහම වැළඳගෙන වුවත් නායක්කාර වංශිකයින් වූ අතර ඔවුන් දකුණු ඉන්දියානු වඩුග පරම්පරාවේ පිරිස් විය. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මිය යෑමෙන් ඔහුගේ මස්සිනා ශ්‍රී විජය රාජසිංහ නමින් සිහසුනට පත්විය.**

නුවර දළදා පෙරහැර එක්කෙළ්ද මේ රජු විසිනි. තිබ්බොටුවාවේ ශ්‍රී බුද්ධරක්ඛිත හිමියන් ලවා චූලවංශය ලියවන ලද්දේද මෙම රජු විසිනි. දඹුලු විහාරය, රිදී විහාරය හා ගෘගාරයම ප්‍රතිසංස්කරණය කිරීමටද රජු කටයුතු කළේය.

වැලිවිට ශ්‍රී අසරණ සරණ සරණංකර හිමියන්ට සියමෙන් උපසම්පදාව ගෙනඒමේ අවස්ථාව ලබා දී ඇත්තේ මෙම රජු විසිනි.

කීර්ති ශ්‍රී රාජසිංහ පළමු වසර කීපය තුළ ලන්දේසි සමග මිත්‍රශීලීව කටයුතු කළ අතර පසුව එය වෙළඳ කටයුතු හේතුවෙන් පළුදු විය. පසුව වැන්එක් නැමැති ලන්දේසි ආණ්ඩුකාර වරයා යටතේ හමුදා බලඇනියක් මහනුවර ආක්‍රමණයට පිවිසුහනහ. රජු ඉංග්‍රීසීන් ගේ උදව් ඉල්ලූවද ඔවුන් එය ලබා නොදුන්නද රජු හා උරණව කටයුතු නොකළහ. 1765 දී ගලගෙ දර හරහා සිදු කළ ආක්‍රමණයෙන් රජු පරාජයට පත්වූ අතර රජු හඟුරන්කෙතට පළා ගියහ.

රජු අල්ලා ගැනීමට ඕලන්ද හමුදා මහත් වෑයමක් දැරීය එහෙත් එය ඉටු නොවීය. සිංහල හටයින්ගෙන් පහර කෑ ඔවුහු විශාල පිරිසක් මිය ගියහ. සමහරු ගිලන් වූහ. හට පිරිස් පසු බැස ගියහ. වැන්එක් ආණ්ඩුකාරයා රෝගාතුර විය. වැන්එක් ගෙන් පසු ෆැල්ක් නැමැත්තෙක් ආණ්ඩුකාර ධූරයට පත්විය. ඔහු එකවර හමුදා බල ඇණි දෙකක් පුත්තලමෙන් හා ත්‍රිකුණාමලයෙන් ගෙන්වා නැගෙනහිරින් හා බටහිරින් උඩරට ආක්‍රමණය කළහ. එයින් රජු තැති ගත්හ. බියට පත් රජු ලන්දේසින් සමග ගිවිසුමකට ගියේය. එම ගිවිසුමෙන් රජුට බොහෝ දේ අහිමි විය.

1779 දී රජු අසුපිටින් වැටී මරණයට පත්විය. ඔහුගේ සොහොයුරු රාජාධිරාජසිංහ නමින් ඊළඟට සිහසුනට උරුමකම් කීය. මෙම රජු සමයේ ඉංග්‍රීසි හමුදා ලන්දේසින් පලවා හැර මුහුදු බඩ ප්‍රදේශ ඉංග්‍රීසි හමුදා යටතට ගත්හ. එයින් වසර දෙකකට පසු රාජාධි රාජසිංහ පරලෝසැපත් විය.

ඉන්පසු සිහසුනට පත්වීමේ උරුමය තිබුණේ මුත්තුසාමිටය. එහෙත් දෙවන බිසවට සිටි පුතු කන්නසාමිය. පිළිමතලව්වේ අධිකාරම්ගේ සහයෙන් කන්නසාමි ශ්‍රී වික්‍රමරාජසිංහ නමින් සිහසුනට පත්විය. පිළිමතලාවගේ අරමුණ වූයේ කන්නසාමි ඔහුට අවනත ආකාරයෙන් කටයුතු කරවා ගැනීමටය. නමුත් එය පසුව නිශ්ඵල විය. පිළිමතලාවේ ඉංග්‍රීසීන්ගේ උදව් ඉල්ලා උඩරට රජ වීමට කුමන්ත්‍රණ කළේය. නෝර්ත් ආණ්ඩුකාරවරයා ඊට සහාය නොදැක්වීය.

1803 මාර්තු 22 ලෙෆ්ටිනන් ටාබට් තුන් දහසක හමුදා සේනාංකයන් සමග කන්ද උඩරටට පැමිණ එය අල්ලා ගන්නා විට නගරය ජන ශූන්‍ය වී තිබුණි. රජු හා සිංහල වැසියන්ද සේනාංකද උපක්‍රමශීලීව පසුබැස තිබූ බව ඉංග්‍රීසින් නොදන සිටියහ.

පිළිමතලාවගේ සැලසුමකට අනුව 1803 ජූනි 24 ඉංග්‍රීසි සේනාව වැටලූ සිංහල සේනාංක ඔවුන් විනාශ කොට නැවත උඩරට අත්පත් කරගන රජු සිංහාසනාරූඪ කරවීය. පිළිමතලාවට සිංහාසනය ලබා ගැනීමේ දොළදුක තිබුණද ඒ අවස්ථාවේ ඔහු එය නොකළේ නමුත් කුමන්ත්‍රණය අත නොහැරිය අවස්ථා දෙකකදී මේ බව රජුට දන ගන්නට ලැබී ඔහුට සමාව දුන්නද තෙවන අවස්ථාවේ සමාවක් නොලැබුණි. ඒ 1811 දී පිළිමතාවේ මරා දැමීමට රජු අණ කළේය.

පිලිමතලාවේ ඝාතනය කිරීමෙන් පසු ඔහුගේ තනතුරට පත් කරන්නේ පිළිමතලාවගේ බෑනා වූ ඇහැලේපොළය. ඔහු දක්ෂ ක්‍රියාකාරී පුද්ගලයෙකු වූ අතර රජු විසින් තමා මරා දමනු ඇතැයිය යන සැකය ඔහු තුළ නිරන්තරයෙන් පැවතුනි.

1814 දී රජුට එරෙහිව සබරගමුවෙන් කැරැල්ලක් මතුවිය. එය ඇහැලේපොල ගේ නායකත්වයෙන් සිදුවූ බව රජු දන ගත්තේය. රජු නැවත ඇහැලේපොල නුවරට කැඳවූයේය. අත්වන ඉරනම දනගත් ඇහැලේපොල කොළඹට පැන ගොස් ඉංග්‍රීසීන්ගේ රැකවරණය ලැබීය. ඉංග්‍රීසීන් සමග එක්ව රජුට එරෙහි කුමන්ත්‍රණ කරන බව දනගත් රජු ඇහැලේපොල කුමාරිහාමි ඇතුළු දරුවන් මරා දැමීය.

ඉංග්‍රීසීන්ගේ කේලාම් හා වයසිබස් අසමින් උන්ගේ රට සුරා පානය කරමින් රඳලයින්ගේ දැඩි පීඩනයෙන් හෙම්බත්වී සිටි රාජසිංහ රජුගේ පාලනය අත්තනෝමතික රාජ්‍ය පාලනයක් බවට පත්වී තිබිණි. ජනයා කෝපවී සිටියහ. මෙයින් ඉංග්‍රීසින් උපරිම පල නෙලීය. ඉංග්‍රීසි ආක්‍රමනය දැඩිව බලවත් විය.

1815 පෙබරවාරි මාසයේ රජු රජ මාලිග යෙන් පළාගොස් මැද මහනුවර පල්ලැහැවත්තේ පිහිටි බෝමුරේ ආරච්චිගේ නිවසේ සැඟවිණි. එක්නැලිගෙ ාඩ නිලමේ දොළොස්වන මොහොට්ටාල මහවලතැන්නේ මොහොට්ටාල ආදී පිරිස් ඉංග්‍රීසි බල ඇණියක් සමග පැමිණ රජු අල්ලා ගත්තේය. 1815 පෙබරවාරි 18 වන දින රජු අල්ලා ගැනීමත් සමග වසර 2358 ක සිංහලේ සිහසුන ඉංග්‍රීසි කිරීටය යටතට පත්විය.

එකල රජු මොනදේ කළත් කුමන ආකාර අකටයුතුකම් කළත් ජනයාගේ විරෝධයේ අවසන් ඵලය වූයේ ලාංකීය රාජ්‍ය උරුමය අවසන් වීමයි.

# නිදහස් ධජය



සිඳු බිඳ වහල් බැමි අදිරද බලය බිඳී
ලද නිදහස අගෙයි සිහ ධජය ලෙල දිදී
ඔද තෙද ජවය ළද ලක්මව ඇකයෙ රැදී
අද නිදහසේ පැවතිය හැක මිහිරි පැදී

කොටි ආවෝ කියා හැම දිනයකම වාගේ
බිය, සැක, පැතිර ගිය කාලෙක සිතට නැගේ
යළි සැනසුම ලැබු සිරිලක් මවට මගේ
අමතක නොවේවා රණ විරුවනගෙ අගේ

ජාතික ධජය ලෙල දෙන්නට ගගන ගැබේ
විරුවන් ජනිත විය පෙර සිට සිහල සබේ
සිගමන් පුරුදු නැත සිරිලක් මවට මගේ
ඒ නිගරුවට වැට බැද ගත යුතුව තිබේ

අසිපත දරා කේසර සිංහයෙකු සිටී
හොඳ හැටි බලව් හෙළ ජාතික ධජයෙ හැටී
පාවා නොදී හෙළ ජාතිත පළිඟු මිටී
සහජීවනය ගැන විමසා බලනු වටී

**කතරගම නිමල් කුඩාතිහී**

# දුටු දුටුවන් මවිත කරන ඊජිප්තු පිරමීඩ



**ලොව පුදුම හතෙන් එකක් බවට පත්ව ඇති ඊජිප්තුවේ නයිල් ගංගාම්ටියාවතේ පිහිටා ඇති පිරමීඩ් අද ද ලෝක විද්වතුන් මවිතයෙන් මවිතයට පත් කරන නිර්මාණයකි. විශාල ගල් කුට්ටි උපයෝගී කරගනිමින් තනා ඇති මෙම පිරමීඩ් ඉදිකිරීම සඳහා යොදා ගත් තාක්ෂණය කුමක්ද යන්න අද වන තුරු ද නිශ්චිත කරගෙන නැත.**

පාරාවෝ පෙළපතේ රජ දරුවන් සිය මරණයෙන් පසු දේහය විනාශ නොවී තැබීමත් ඒ දේහය අසල භව භෝග සම්පත් රන් රිදී මුතු මැණික් ආදී වටිනා ද්‍රව්‍ය තබා තිබීමත් තමන් පරිහරණය කළ දෑ ඒ අසල තිබීමත් නිසා මරණින් මතු ජීවිතය යහපත් වන බව විශ්වාස කරන්නට ඇත.

එවන් විශ්වාස වල ප්‍රතිඵලයක් වශයෙන් මේ පිරමීඩ් ඉදිවී ඇත. විශ්වාසය කෙසේ වෙතත් වර්තමාන ලෝකය පුදුමයෙන් පුදුමයට පත්කරන ලද්දක් බවට පත්වී ඇත. අක්කර 1 ක් පුරා විසිරී ඇති මෙම පිරමීඩ සංකීර්ණය ඉදි කලේ කෙසේද යන්න අදද සිතා ගැනීමට ද නොහැක. මෙම පිරමීඩයක් තුළ වර්තමානයේ දක්නට ඇති දේවස්ථාන 5 ක් පමණ ඉදිකිරීමට තරම් ඉඩකඩක් ඇත. එහි උස අඩි 480 කි. එනම් තට්ටු 40 ක් තරම් උස ගොඩනැගිල්ලක උසය.



ටොන් දෙක හමාරේ සිට ටොන් 50 දක්වා බරක් ඇති අච්චු ගල් මිලියන 2.3 ක් පමණ එක උඩ එක තබා ඇත. නැපෝලියන් නැමැති ගණිතවේදියා පවසන පරිදි එක පිරමීඩයක ඇති ගල් හා එහි ඇති බදාම එක් කළ විට අඩි 10 ක් උස අඩි 3 ක් පළල ප්‍රාකාරයක් ප්‍රංශය වටා ඉදිකිරීමට තරම් ප්‍රමාණවත්ය. ගල් දෙකක් අතර පරතරය ඉතා සියුම්ය. සියුම්ම කඩදාසියක් ඒ තුළින් රිංගවිය හැකිය. සෑම පිරමීඩයකම නිරිත දිග කොන ඊසාන දිග කොනට වඩා අඟල් භාගයක උසින් වැඩිය. එහි දිගම හා කෙටි පැති දෙක අතර වෙනස අඟල් 8 කි. පිරමීඩයේ බෑවුම 0.9% කි.



කෙතරම් නවීන විද්‍යාඥයන් මෙය නිරීක්ෂණය කළද මේ විශාල ගල් කුට්ටි ඉහළට එසවූයේ කෙසේද යන්න තාමත් අනුමාන කර නැත. වර්තමාන දියුණු තාක්ෂණයන් ඔස්සේ පරීක්ෂණ කලද මෙහි හෙළිවූ දෙයට වඩා හෙළි නොවූ කරුණු අති විශාලය. මෙය එසවූවා පමණක් නොව ඔසවා නිසි ලෙස එහා මෙහා කර අදාල හැඩ තලය අනුව තැබුවේ කෙසේද? අති විශාල මිනිස් ශ්‍රමයක් මෙයට යොදා ඇතැයි සමහරු කියති. ඒසා විශාල සෙනගකට මෙම අච්චු ගල් කුට්ටියක් මත අත ගැසීමට එකවර හැකිද?



පිරමීඩ් ගර්භය ඉදිකරන ලද රතු හා රළුගල් ගීසා සානුවෙන් කපාගෙන ඇති අතර හුණු ගල් ගෙන ඇත්තේ නයිල් නදියේ නැගෙනහිර ඉවුරෙනි. කුටි සෑදීමට අවශ්‍ය කලු ගල් ගෙන ඇත්තේ ඊට සැතපුම් 600 ක් දුරින් පිහිටි අස්වාන් ප්‍රදේශයෙනි. එපමණ දුරක සිට මෙම ගල් නයිල් නදිය ඔස්සේ දිය මතු පිටින් ගෙන විත් ජල මාර්ග ඔස්සේ ගෙන එන්නට ඇතැයි විශ්වාස කරයි.

මෙම පිරමීඩ් සංකීර්ණය තුළ ඇති පාරාවෝ රජුගේ පිරමිඩය විශේෂය. ඔහු මුලින් විශාල වලක් හාරා එය සිය සොහොන ලෙස භාවිතා කරන්නට සිතන්නට ඇත. එයට බැසීමට පඩිපෙලද ඉදිකළේය. පසුව සිය පරපුරේම මමී සහ වස්තුව තැබිය හැකි ලෙස පිරමීඩයක් ලෙස ඉදිකිරීමේ අදහස පහළ වී තිබේ. ඒ අනුව ඒ තුළ රජුට හා බිසවට විශාල ශාලා දෙකක් ඉදිකර තිබේ. රජුගේ ශාලාව පිහිටා ඇත්තේ අඩි 140 ක් උඩින්ය. පිරමීඩයට ඇතුළු වන එකම දොරටුව අසලින් ඇති පඩි 13 ක් නැග එයට ඇතුළු විය යුතුය.

ක්‍රි.ව. 820 දී ඊජිප්තුවේ රජ කළ අබ්දුල්ලා අල් මවුන්ට මෙම පිරමීඩය කඩා බැලීමේ අදහසක් පහළ විය. එහි දිරා නොයන යකඩ හා දැඩි වීදුරු ද විය. කුඩා අඩි පාරක් දිගේ ඔවුන් රැජිනගේ සොහොන් ගැබට ඇතුළුවිය. එම මමිය නොතිබුණි. රජුගේ සොහොන් ගැබද හිස්ව තිබුණි. නැවත 176 දී මෙහි තවත් මාවතක් හමුවිය. එය අඩි 200 ක් පමණ දිගින් යුක්තය. එය ප්‍රධාන ශාලාවට තිබූ මාවතකි.

මෑත කාලීනව හමුවූ තුතන් කහමන් රජුගේ සොහොන් ගැබ කිසිඳු නිදන් සොරෙකුට හසුව නොතිබූ අංග සම්පූර්ණ සොහොන් ගැබක් විය. එහි මමිය ද එසේම පැවැතුනි. වස්තුවද එලෙසම පැවතුනි.

මිනිසුන්ට විශ්වාසයන් ඕනෑතරම් තිබිය හැක. එහෙත් මෙවැනි නිර්මාණයක් කිරීමේ තාක්ෂණය අද වන විට අහිමිව ඇත්තේ කෙසේද? එය පරපුරෙන් පරපුරට නොපැමිණියේ එහි ඇති රළු දෘඪ වෙහෙසකර බව නිසා විය නොහැකිද? එසේ නැතිනම් එම පරපුරේ අවසානය ත් සමග හැකියාවන්ද විනාශවීම නිසාවත්ද?


නිවාස නිරෝධායනයට ලක්ව සිටින්නා
දැනුවත් විය යුතු කරුණු
හැම මොහොතකම ගෙදර සිටින්න
මුහුණු ආවරණයක් පළඳින්න
රෝග ලක්ෂණ වර්ධනය වුවහොත් සෞඛ්‍ය තත්වය අධීක්ෂණය කරන්න ඒමෙන්ම ඉක්මන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න
හැකි නම් හොඳින් වාතාශ්‍රය ඇති තනි කාමරයක රැඳී සිටින්න
හැකිතාක් වෙනත් පුද්ගලයින් සමඟ දුරස්ථතාවයක් (අවම වශයෙන් මීටර 1 ක් දුරින්) පවත්වා ගන්න
සෑම කාණු කටකටම (යූ-උගුල්) නිතිපතා ජලය වත් කරන්න
වැසිකිළිය භාවිතා කිරීමෙන් පසු, වැසිකිළි පියන වතුර ගැසීමට පෙර වසා දමන්න
තුවා හෝ පුද්ගලික අයිතම අන් අය සමඟ බෙදා ගැනීමෙන් වළකින්න
ආහාර බෙදා ගැනීම සහ ආහාර ගැනීමට රැස්වීමෙන් වළකින්න
දුම් පානය හා මත්පැන් පානය කිරීමෙන් වළකින්න
衛生防護中心
Centre for Health Protection
更多防疫資訊
For more information on fighting the virus:
www.coronavirus.gov.hk
衛生防護中心Facebook專頁
Centre for Health Protection Facebook Fanpage
fb.com/CentreforHealthProtection
衛生署
Department of Health
二零二零年三月製作
Produced in March 2020

ස යු රේ න්
එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

**නිදහස් දිනය නිමිත්තෙනි.**

# සිංහල නැගී සිටීම සැමදා අඩපන වූයේ පාවා දෙන්නන් නිසාය.

**ලාංකීය ජාතිය සැමදාම වරදාන වරප්‍රසාද අපේක්ෂාවෙන් ජාතිය ආගම පාවා දුන් ජාතියකි. මෙය අදක ඊයෙක සිදු වූවක් නොවේ. ඉතිහාසයේ ඕනෑ තරම් සිදුවීම් ඇත. අද ද එසේම වන්නේය. ජාතියේ රාජ්‍යත්වය පවා මේ රටේ ජාතිය පාවා දී කෙටිකාලීන වරප්‍රසාද භුක්ති විඳ ජාති ද්‍රෝහීන් දේශ ද්‍රෝහීන් වශයෙන් ඉතිහාසයේ සදාතනික අප කීර්තිය උරුම කරගත් බොහෝ දෙනා සිටිති.**

අප රට ඉංග්‍රීසීන්ට නතුවීමෙන් පසු නිදහස් අරගලය උදෙසා කළ සටන් වලදී ජාතික වීරයින් මළ පුඩුවට ගෙන ගිය පාවා දීම් රැසක් මෙම ලිපියෙන් අනාවරණය වෙයි.

1818 සිංහලේ පළමු නිදහස් සටන අපේම ජනතාවගේ පාවාදීම් නිසා ජීවිත සිය ගණනක් විනාශ කර ගිනිමින් පරාජිතව අවසන් වූ අතර රටට අහිමි වූ වීරෝදාර සෙන්පතියන් අතර මොනරවිල කැප්පෙටිපොල මහා අදිකාරම්, පිළිමතලාවේ හා මඩුගල්ලේ නිලමේ, කිව්ලේගෙදර මොහොට්ටාල, බූටාවේ රටේ රාල, ඉහගම ස්ථවිරයෝ ආදී මෙකී නොකී නායක කාරකාදීහු රැසකගෙන් සමන්විත වූහ.

එම සටන් 1818 න් පසු අවසන් වූ අතර ඊට වසර 30 කට පසු නිදහස් සටනේ දෙවැනි ඉම 1848 දී මාතලෙන් ආරම්භ විය. එය පසුව කුරුණෑගල හා මහනුවර දක්වා ව්‍යාප්ත විය. මෙකල අපේ රටේ ආණ්ඩුකාර තැන්පත් ටොරින්ටන් සාමිතුමාගේ නව බදු ප්‍රතිපත්තියට විරුද්ධව විමුක්ති සටන වෙනුවට බදු විරෝධී සටන් ආරම්භ විය.

1848 ජූලි මාසයේදී අලුත්ම බදු වර්ග කීපයක් හඳුන්වා දෙන ලදී. බලු බද්ධ. ඇඟ බද්ද, තුවක්කු බද්ධ ජනතාව මත පැටවීම ජනතාවට දරාගත නොහැකි විය. ගිහියන්ට අමතරව ස්වාමීන් වහන්සේලාගෙනුත් ඇඟ බද්ද අය කිරීම නිසා මෙම තත්ත්වය වඩාත් උග්‍ර විය. මෙයට විරුද්ධ වූ සිංහලේ සටන්කාමීන් ඔවුන්ගේ බළකොටු වලට පහරදීමට තරම් යුධ ශක්තියක් නැති නිසා කෝපි වතුවල සිටි යුරෝපීයන්ට පහර දෙන ලදී. වාරියපොල වත්තට මුලින්ම පහර දුන් අතර මෙය මැඩ පැවැත්වීමට මහනුවරින් සේනාංකයක් යවන ලදී. මෙම සටනින් සිංහලේ සටන්කාමීන් 200 ක් පමණ ජීවිතක්ෂයට පත්වූහ. මෙහිදී මැලේ ජාතික සොල්දාදුවෝ කිනිස්සෙන් ඇන සිංහලයින් මරා දමූහ. මෙම සටන මෙහෙයුවූයේ දකුණින් පැමිණි පුරන් අප්පු නම් සටන්කාමියෙකි. ශ්‍රී ලාංකිකයන්ට රජෙක් නොමැතිව කල් ගෙවිය හැකි ජාතියක් නොවේ. එම නිසා 1848.07.30 වැනිදා දඹුල්ල විහාරයේදී ගොන්ග ාලේගොඩ බණ්ඩාට සිහසුන භාර කරන ලද්දේ ගිරන්නේගම ඉන්ද්‍රජෝති හිමිගේ ප්‍රධානත්වයෙන් පැවති රාජාභිෂේකයේදීය. මෙහිදී යුවරජ තනතුරට වීදි පැලැල්ලේ බණ්ඩාත් මහ ඇමති තනතුරට පුරන් අප්පුත්, දිනිස් හා කරෝ අප්පු සේනාධිනායක තනතුරුවලට පත් කරගන්නා ලදහ. මේ සියලු තොරතුරුම ඉංග්‍රීසීන්ට

පවසන ලද්දේ වැබැද්දේ නිලමේ විසිනි. මේ රාජාභිෂේකයට සහභාගි වූ සියලු දෙනා අත්අඩංගුවට ගෙන මරා දැමීමට ඉංග්‍රීසිහු නියෝග කළහ. මේ අනුව කඳපොල බස්නායක නිලමේත් මිල්ලෑවේ මහනිලමේත් හැවන්පොල කෝරලේත් අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කරන ලදී.

1948 අගෝස්තු 01 වැනිදා දිනිස් හා කරෝ අප්පු කුරුණෑගලට පහර දී ඉංග්‍රීසීන් පලවා හැර කච්චේරියේ තිබූ පවුම් 1500 කුත් සිංහලෙන් සිරකරුවනුත් මුදා ගන්නා ලදී. මින් කුපිත වූ ඉංග්‍රීසිහු සිංහලේ ගම්වැසියන්ගේ ගේ දොර සහ විහාරස්ථාන ගිනිබත් කළහ. කුරුණෑගල සිදු කළ ප්‍රහාරයෙන් පසුව සිංහලේ නායකයින් රඹාවේ පන්සලේ සිටිනා බව සිංහලේ




ඔත්තුකරුවන් ඉංග්‍රීසීන්ට දැනුම් දෙන ලදී. එම ප්‍රදේශ භාරව සිටි කපිතාන් මැක්ඩොනල්ඩ් සිංහලයින්ට සිංහලයින් ලවාම පහර දීමට දරම්ටිවැවේ රටේ මහත්තයා යොදා ගන්නා ලදී. රඹාවේ පන්සලේ සිට සිංහල හමුදාව එතනින් ලූණුකඩ වැල්ල බලා පිටත් වූ අතර මෙම පිරිස 5000 කින් පමණ සමන්විත වූහ.

ලූණුකඩ වැල්ලේදී සිංහලේ හමුදාවට තවත් අතිරේක පිරිසක් එකතු වූහ. ඔවුන් නම් දරම්ටිපොළ රටේ මහත්තයාගේ බත් බැලයන්ය. මැදියම් රැය පමණ වන විට මේ නරුමයා යුව රජතුමා නිදා සිටි කාමරයට ඔහුගේ පිරිස සමඟ පැන යුවරජතුමා අල්ලා ගත්තේය. ඒ සමගම සිටි තවත් නායකයින් 20 දෙනෙක් පමණ අත්අඩංගුවට ගෙන පිරිසක් මැද සිට යුව රජතුමා ඉංග්‍රීසි හමුදාවේ එක ලේ බිඳක් වත් නොසොල්වා අල්ලා ගැනීමට හැකිවීමයි. අල්ලා ගත් පිරිසට නඩු අසා ඒ අවස්ථාවේම මරණ දඬුවම පමුණුවන ලදී. හඟුරන්කෙත ඩිංගි රාල හෙවත් වීදි පැල්ලේ බණ්ඩා යුව රජතුමාට විරුද්ධව තිබූ චෝදනාව කියවා ඉන් පසු යුව රජතුමාගෙ න් මේ පිළිබඳ විමසීය. ඔහු ප්‍රකාශ කළේ චෝදනා පිළිබඳ කිසිම දෙයක් මට කීමට නැ යනුවෙනි. ඉන් පසු යුද්ධාධිකරණ ප්‍රකාශ කළේ උතුම් වූ ඉංග්‍රීසි අග රැජිනිගේ සාධාරණ ආණ්ඩුවට ද්‍රෝහීව කැරලි ගැසීමෙන් හා කුමන්ත්‍රණ කිරීමෙන් මූලිකව කටයුතු කළ යුෂ්මතා තව මොහොතකින් මෙහිදී වෙඩි තබා මරා දැමිය යුතු යැයි අපි තීරණය කරමු. යුෂ්මතාගේ සිරුර නැගෙනහිර කඩවතේ ප්‍රසිද්ධ ස්ථානයක දින 04 ක් එල්ලා තැබීමට අපි නියෝග කරමු. මෙම දේශප්‍රේමී ජාතිමාමක රණවිරුවා 1848 අගෝස්තු 05 වැනි දින මෙසේ සිංහලයින්ගේ පාවාදීම නිසා ජාතියට අහිමි විය. නඩු තීන්දු වෙන් නියෝග කළ පරිදි මළ සිරුර දින 04 ක් ගසක එල්ලා තිබුණි.

ඉංග්‍රීසීන්ට විශාල අභියෝගයක් එල්ල කළ මාතලේ නිදහස් සටන මෙහෙය වූ පුරන් අප්පුත් සිංහලේ රජකම දරා සිටින ගොන්ගාලේගොඩ බණ්ඩාත් අල්ලා ගත හොත් සිංහලේ නිදහස් සටන කෙළවර කිරීමට හැකි බව තේරුම් ගත් ඉංග්‍රීසීහු සිංහල මිනිසුන්ට වරදාන දී මේ දෙදෙනා අල්ලා ගැනීමට තීරණය කළහ. දිසාපති බුලර් මහතා දිස්ත්‍රික්කයේ සියලුම සිංහල නිලමේවරුන් දිසාපති මැදුරට කැඳවුවත් දුම්බර රටේ මහත්වරුන් වූ මඩුගල්ලේ හා හල්පේ ඊට සහභාගි නොවූ නිසා එදිනම ඔවුන් ධූරයෙන් නෙරපන ලදී.

7 වෙනි පිටුවට....

6 වෙනි පිටුවෙන් ....

# සිංහල නැගී සිටීම සැමදා අඩපන වූයේ පාවා දෙන්නන් නිසාය.

මේ බව දැනගත් පල්ලමේ කුඹුරේ බස්නායක නිලමේ ඉංග්‍රීසීන් වෙත ගොස් එම තනතුරු දෙක තමාටත් තම පුතාටත් ලබා දෙන්නේ නම් සිංහලේ රජු අල්ලා දෙන බවට ප්‍රතිඥා දුන්නේය. පල්ලමේ කුඹුරේ බස්නායකගේ දැනුම් දීම මත සතුරු රජුගේ තොරතුරු දන්නා කාහගල්ලේ ගල් ලෙනක සැඟවී සිටි භික්ෂූන් වහන්සේ නමක් අල්ලා ගන්නා ලදී. මේ හිමි නමට විරුද්ධව සාක්ෂි දීමට එම බස්නායක නිලමේත් ඔහුගේ පුතාත් වීදිය පැල්ලේ නිලමේත් ඉදිරිපත් වූහ. නඩු අසා උන් වහන්සේ මරා දමන ලදී. එසේ මරණයට පත් කළේ කුඩා පොළ හිමියන්වයි. මේ අසෝබන සිදුවීමට ඉංග්‍රීසි නීතිඥවරුද විරුද්ධ වූහ. පසු කළෙක ටොරින්ටන් සාමිට සිය ධුරය පවා අහිමි වූයේ මේ සිදුවීමයි. සිංහලේ ද්‍රෝහීන්ගේ ක්‍රියා නිසා කැරැල්ල දවසින් දවසම අඩාළ විය. මේ පොදු සටන පාවා දී ඉංග්‍රීසීන් ගෙන් තාන්න මාන්න ලැබූ බත් බැලයන්ගෙන් උඩරට පිරී පැවතුණි.

සිංහලේ සටනට දක්ෂ බවක් පෙන්වා පුහු අනුරාග යකින් සටන් බිමට එන සිංහලේ ද්‍රෝහීන් ගැන පුරන් අප්පු විමසිල්ලෙන් පසු විය. සටන් බිම ආරම්භ වූදා සිට පුරන් අප්පු සමඟ සිටි හේවා හකුරුගේ හා බැද්දගේ අල්ලීස් යන දෙදෙනා 1848.08.06 වැනිදා ඉංග්‍රීසි හමුදාවට පහර දී පැමිණියා යැයි පුරන් අප්පුට පවසා ඔවුන් සමඟ පැමිණි පුංචි අප්පු, ඇල්ලේපොල, හොදිගේ, වීරනෙත්ති, රුප්පු කුට්ටි, අරුමුගම්, කාරියවසම් යන 7 දෙනාත් එදින පුරන් අප්පු සමඟ රාත්‍රිය ගත කළහ. අල්ලීස් හා හේවා හකුරුගේ සමඟ බොහෝ වේලාවක් කතාකරමින් සිටි සේනාධිනායක තෙමේ ගල් ගෙය තුළ නින්දට ගියේය.

මධ්‍යම රාත්‍රිය ඉකුත් වී ටික වේලාවකින් ගල් ගෙය තුළට කඩා වැදුණු මේ අමුත්තෝ 09 දෙනා සිංහලේ සේනාධිනායකයාගේ දෑත් දෙපාත් බැඳ දමා 1848 අගෝස්තු 07 වැනිදා ඉංග්‍රීසීන්ගේ සිරකරුවෙකු වශයෙන් මාතලේ කඳවුරට ගෙන ආහ. ඉංග්‍රීසීන්ගේ රහස් පොරොන්දුවක් අනුව සිංහලේ සේනාධිනායක පුරන් අප්පු සිරකරුවෙකු වශයෙන් අල්ලා ගෙන වුත් ඉංග්‍රීසීන්ට බාර කළ සිංහල ද්‍රෝහීන් 09 දෙනාත් සිරකරුවන් වශයෙන් මහනුවරට පිටත් කර හැරීම කාගේත් විමතියට හේතුවක් විය.

සිය දේශයේ නිදහස තකා සටන් කළ ජාතික වීරවරයකු ප්‍රසිද්ධියේම විදේශිකයින්ට පාවා දීමට තරම් ද්‍රෝහිකමක් කළ පිරිසකගෙන් කිසිදු පක්ෂපාති බවක් බලාපොරොත්තු විය නොහැකි බව ඉංග්‍රීසි ආණ්ඩුව ප්‍රකාශ කරන ලදී. පසුව යුද්ධාධිකරණයේ නඩු අසා පුරන් අප්පු වැරදිකරුවකු බවට පත්කොට 1849 අගෝස්තු 08 වැනිදා සවස 2.30 ට සිංහලේ සේනාධිනායකයාව සිටි පුරන් අප්පු දෑතේත් දෙපයේත් විලංගු සහිතව ඝාතක සේනාංකය ඉදිරියේ පෙනී සිටියේය.

පොදු ජනතාව වෙනුවෙන් ජාතික සටනක් මෙහෙයවීමේ ගෞරවය ලැබූ සිංහලේ සේනාධිනායක පුරන් අප්පු ඉංග්‍රීසි ඝාතක හමුදාවෙන් නිකුත් කළ වෙඩි උණ්ඩ හමුවේ ළය පෑවේය. ද්‍රෝහීන්ගේ මරු උගුලක බැඳී ඉංග්‍රීසීන් වෙත පැමිණි ජාතියේත් දේශයේත් අනාගත විමුක්තිය සලකා සිය මව්බිම වැලඳ ගෙන අවසන් සුසුම් පොද හෙළීය.

සිංහලේ නිදහස් සටනේ රජතුමා ලෙස සිටි උඩුනුවර ගොන්ගාලේගොඩ මැක් රාල හෙවත් ගොන්ගාලේගෙ ාඩ බණ්ඩා ද ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට පත් විය. 1848.11.14 වන දින නඩු අසා 1849.01.06 වැනිදා බෝගම්බර හිරගෙදර තුළදී එල්ලා මරා දමන ලදී. 2 වැනි නිදහස් අරගලයේදී සිරභාරයට ගත් පිරිස 380 ක් වූහ. 126 දෙනෙකු නඩු අසා මරා දමන ලදී.

දවස් 79 ක් තිස්සේ මාතලේ කුරුණෑගල මහනුවර යන ප්‍රදේශ පුරා ගෙන ගිය දේශමාමක දේශානුරාගයෙන් ඔද වැඩුණු සිංහලේ සටන්කාමීන් විවිධ අන්දමින් 1000 කට ආසන්න පිරිසක් මරනයට පත් වුවද එකම ඉංග්‍රීසි හටයෙක්වත් මෙහිදී ජීවිතක්ෂයට පත් නොවීම සුවිශේෂී තත්ත්වයකි. මෙම ලිපියෙන් පෙන්වා දීමට අදහස් කළේ මීට වසර 170 කට පමණ පෙර දිනා ගැනීමට තිබූ රට දිනා ගැනීමට නොහැකි වූයේ රට ගැන නොව බඩ ගැන සිතූ පාපතරයින් නිසාවෙනි. අදත් එසේමය.


Ceylon Shipping Lines Ltd.
Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

Ceylon Shipping Lines Ltd.,
Printing Department,
No. 758/3, Dr. Danister De Silva Mawatha,
Colombo 09.
Tel: 011 - 2683237 Fax: 011 - 2683238
E- mail: cslpri@sltnet.lk

Head Office:
Ceylon Shipping Lines Ltd.,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

# නිරෝගී බව ආරක්ෂාවට "කොළ කැඳ"

බුද්ධ දේශනාවේද කැඳ ගැන සඳහන් වන අතර කැඳ පානයෙන් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා වැඩෙන බවත්, ශරීරයේ කුසගිනි, පිපාස නසා වාතය සමනය කරන බවත් දක්වේ.

වත්මන් සමාජයේ පිරිස් අතර බහුලව දක්නට ලැබෙන නිදන්ගත රෝග නිසා කොළකැඳ පානය කිරීම සඳහා ප්‍රවණතාවයක් ඇතිව තිබේ. ආයුර්වේදයේ ප්‍රධානම අරමුණ වන නිරෝගී බව ආරක්ෂා කිරීම සඳහා "කොළකැඳ" මඟින් ලැබෙන්නේ ප්‍රබල දායකත්වයකි.

නවීන මුළුතැන්ගේ උපාංග භාවිතයෙන් පහසුවෙන් සකසා ගතහැකි වීම නිසාද එහි ඇති විවිධ ප්‍රිය මනාප රසයන් නිසාද "කොළ කැඳ" බොහෝ දෙනා අතර ජනප්‍රිය ය. අඩු වියදමකින් සපයා ගත හැකි පෝෂ්‍ය ගුණයෙන් ඉතා වැඩි ආහාර වේලක් වශයෙන්ද කොළ කැඳ හඳුන්වා දිය හැක.

රසවත් ගුණවත් කොළ කැඳ පානයකට යොදාගත හැකි ජනප්‍රියතම ශාක වර්ග අටක් ගැන ගුණාගුණ සහිතව සංක්ෂිප්තව තොරතුරු රැසක් මෙම ලිපියෙන් විස්තර වේ.

## ගොටුකොළ



කොළ කැඳ සඳහා භාවිතයට ගන්නා ජනප්‍රියතම ශාක පත්‍ර විශේෂයකි. වානිජ වගාව සඳහා වැඩි දියුණු කරන ලද ප්‍රභේද වලට වඩා වැල් වශයෙන් බිම දිගේ ඇදෙන, කුඩා පත්‍ර සහිත ගොටුකොළ කැඳ සඳහාද, ආහාරය සඳහාද වඩා ගුණදායකය. ගොටුකොළවල පත්‍ර, දඬු, මුල් සියල්ලම කැඳ සඳහා භාවිතා කළ හැක.

බුද්ධි වර්ධනයට සහ මතකය වැඩිදියුණු කිරීමට ගොටුකොළ වැදගත් වන හෙයින් කුඩා ළමුන්ටද ගොටුකොළ කැඳ යෝග්‍යය, ගොටුකොළ සමඟ රතුලූණු මිශ්‍ර කර කැඳ සාදාගැනීමෙන් පීනස ඇතුලු සෙම්රෝග, ශීර්ෂ රෝග, සමේරෝග ආදිය සමනය කර ගත හැකිය. අකලට හිසකෙස් පැසීම, ඇස් දැවිල්ල සහ කබ ගැලීම වැනි රෝග ලක්ෂණ සහිත රෝගීන්ට කොටුකාළ කැඳ ප්‍රත්‍යක්ෂය.

## මොණරකුඩුම්බිය




ග්‍රහ, මලබද්ධ සහ අක්ෂි රෝග වලින් පීඩා විඳින්නන්ට මොරණරකුඩුම්බිය කැඳ භාවිතය ගුණදායකය. බුද්ධි වර්ධනය සහ මතකය වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිශක්තිකරණයට ඇති හැකියාව නිසා කුඩා දරුවන් සඳහාද යෝග්‍ය වේ.

වල් පැලෑටි ලෙස ගලවා ඉවත් කෙරෙන ගෙවතුවල සුලභව වැවෙන ඖෂධීය පැලෑටියකි. පංචාංගය සහමුලින්ම ගෙන කැඳට යොදාගත හැක. නමුත් කැඳ සඳහා භාවිතා කළ යුත්තේ මල් නොපිපුණු අවධියේ පවතින මොරණරකුඩුම්බිය ශාකයයි.

## මුකුණුවැන්න



බොහෝමයක් දෙනා හොඳින් හඳුනන, නිරන්තර ආහාරයට ගන්නා පළා වර්ගයකි. නමුත් සැබෑ මුකුණුවැන්න වලට වඩා හාත්පසින් වෙනස් ප්‍රතිඵල දෙන ඇලි ගේටර් වැනි ශාකද මුකුණුවැන්න වෙනුවට වෙළඳපොළේ විකිණේ.

හිසකෙස් වඩවයි. සිරුර සිසිල් කරයි. මානසික අවපීඩනය, කාංසාව වැනි රෝගී තත්ත්වයන් වළක්වාලයි. එවැනි රෝගීන්ට දේශීය වෛද්‍යවරුන් නිර්දේශ කරන කැඳකි.



## පොල්පලා



දිවයින පුරා ගෙවතුවල සුලභව වැවෙන ඖෂධීය පැළෑටියකි. පංචාංගය සහමුලින්ම ගෙන කැඳට යොදා ගත හැක.

මුත්‍රා අසාදන සඳහා තම්බා පානයටද ගන්නා ඖෂධයක් වන පොල්පලා, කැඳ වශයෙන් පිළියෙල කර පානය කිරීමෙන් මුත්‍රා දැවිල්ලට සහනය ලබාදී සිරුර සිසිල් කරයි. වකුගඩු වල රෝග, ඉදිමුම් සහ අසාදන වළකයි. මුත්‍රා ගල් දියකරයි. ශරීර අභ්‍යන්තර ආසාදන වැළැක්වීමටද පොල්පලා කැඳ වැදගත් වේ.

## කරපිංචා



විශේෂයෙන් හඳුන්වා දිය යුතු නැති, ආහාර රසකාරකයක් ලෙස භාවිතා කරන කරපිංචා, කැඳක් ලෙස භාවිතයෙන් ශරීරයට බොහෝ ගුණයන් ලබාගත හැක.

කරපිංචා කැඳ ප්‍රනීත රසයකින් යුක්තය. රුධිර නාල පිරිසිදු කර, රුධිර සංසරණය ක්‍රමවත් කර, අධික රුධිර පීඩන අවස්ථා සමනය කිරීම කරපිංචා කැඳ පානයෙන් ශරීරයට ලැබෙන මූලික පිටුවහලයි.

අනවශ්‍ය මේදය දියකර හරියි. ආමාශයික සහ ආන්ත්‍රික විෂ මර්ධනය කරයි.

## වැල්පෙනෙල



ගාල් ලෙස බිම් මට්ටමේ වැවෙන පියකරු හරිත පැහැයෙන් යුත් වැල් වර්ගයකි. පත්‍ර සහ නොමේරූ දඬු කැඳට භාවිතා කළ හැක. සමහර රෝග අවස්ථාවන්වලදී සම්පූර්ණ වැලම ඖෂධ ලෙස, කැඳ ලෙස භාවිත වේ.

නිරක්තිය, කෙට්ටුවීම, ධාතු හිඟකම, දරුඵල නොමැති වීම ආදී රෝගීන්ට ගුණදායක කැඳ වර්ගයකි. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම කෙරෙහිම ඉහත රෝග සඳහා භාවිතා කළ හැක. අතීත ගැමි සමාජයේ අලුත විවාපත් වූ තරුණ තරුණියන්ට අනිවාර්යයෙන් සකසා දෙන කැඳකි. නමුත් සෙසු වයස් වල අයටද එකසේ භාවිතා කළ හැක. රුධිරය වඩයි. ශරීරයේ ධාතු කොටස් වර්ධනය කර සෞම්‍ය කරයි. දරුඵල අහිමි අවස්ථාවල සරුභාවය වැඩි කිරීමට භාවිතා කරයි.

## ඉරමුසු



මැදින් සුදු ඉරක් සහිත තද කොළපාට දිගැටි පත්‍ර සහිත, පොළවේ පහළ මට්ටමේ වැවෙන දෘඩ වැළකි. ඉම්හිරි සුවඳකින් යුක්තය. එනිසා තනිව යොදාගන්නවාට වඩා වෙනත් ශාක ද්‍රව්‍ය සමඟ මිශ්‍රව කැඳ සාදා ගැනීම යෝග්‍යය.

## හාතාවාරිය




සිරුරෙන් මතුවන දුගඳ වළකාලයි. ප්‍රියමනාප පෙනුමක් ඇති කරයි. අත්පා වල දැවිල්ල, කුෂ්ඨ, සමේ බිබිලි වැනි තත්ත්ව ඇති රෝගීන්ට සහ එවැනි රෝග වළක්වා ගැනීමට අපේක්ෂා කරන අයට යෝග්‍ය වේ. සැරසිලි වලට පවා ගන්නා අලංකාර වැළකි.

රුධිරය වර්ධනය කරයි. මද සරු භාවය දුරු කරයි. දුර්වල වූ ශරීර ප්‍රාණවත් කරයි. තනිව යොදාගන්නවාට වඩා වෙනත් ශාක ද්‍රව්‍ය සමඟ මිශ්‍රව කැඳ සාදා ගැනීම යෝග්‍යය.








# දොළොස් වසරක් පුරා ISO ප්‍රමිති සහතිකයෙන් පිදුම් ලබන

# සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාෂන මධ්‍යස්ථානය

ලොව පුරා විහිදී ඇති ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය හෙවත් **ISO** ආයතනය ලොව සෑම රටක්ම පිළිගත් ආයතනයකි. මෙම ආයතනයේ නියෝජිත ආයතන මගින් සිදුකරන්නේ ලොව ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීමයි. මෙම ආයතනය මගින් ප්‍රමිති සහතිකය දිනා ගැනීම සුළුපටු කාර්යයක් නොවේ. එවැනි ආයතනයන්හි ඉහළ කළමනාකාරිත්වයේ සිට පහළම සේවකයා දක්වා තම තමන්ගේ කාර්යභාරය පමණක් නොව ලිපිලේඛන පවා ජාත්‍යන්තර මට්ටමින් ලොව පිළිගත් පිළිවෙළට පවත්වාගන යායුතුය.

මේ සියලු අංශයන් නිසි පරිදි ඉටුකිරීම පිළිබඳ දීර්ඝ විමර්ශනයකින් පසු 2009 වසරේදී සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාශන ආයතනයට **ISO** ප්‍රමිති සහතිකය හිමිවිය.

එම සහතිකය ප්‍රකාරව තත්ත්ව පාලන ප්‍රතිපත්තියක් හා දැක්මක් ප්‍රකාශයට පත්වී ඇත. ඒ අනුව අපගේ තත්ව ප්‍රතිපත්තිය නම් අපගේ පාරිභෝගිකයින් ගේ හා සේවාලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අපේක්ෂාවන්ට ගෙවන මුදලට සරිලන කාර්යක්ෂම උසස් තත්වයේ සේවාවක් ලබාදෙමින් දේශීය හා විදේශීය වෙළඳපලේ කීර්තිය දිනා ගත් මගී ගමන් බඩු නිශ්කාශන හා ගුදම් ගත සේවාවක් ජාත්‍යන්තර අනර්ඝතම මට්ටමට අනුව පවත්වාගෙන යාම අපගේ ආයතනයේ ප්‍රතිපත්තිය වේ.




පාරිභෝගික තෘප්තිය හා නිරන්තර වැඩිදියුණුව ඇතිකරමින් පද්ධතිය තුළ මනා තත්ව කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර නිවැරදි කිරීමේ හා වළක්වා ගැනීමේ ක්‍රියා මාර්ග මගින් තත්ව පද්ධතියේ කාර්යක්ෂමතාවය නිරන්තරව වැඩි දියුණු කරනු ලබන අතර අභ්‍යන්තර හා බාහිර විගණනය නිරන්තරව සිදුවෙයි.

තත්ව ප්‍රතිපත්තියට අමතර තවත් ප්‍රධාන අරමුණු තුනක් ඇත. එනම්

1. භාණ්ඩ හැසිරවීමේදී සිදුවන හානිය 2.5% දක්වා අඩු විය යුතුය. එනම් පාරිභෝගිකයාගේ භාණ්ඩ සඳහා 97.05% ක ආරක්ෂාවක් සහතික විය යුතුය. ඉතාමත් පරිස්සමින් හා ආරක්ෂාකාරී ලෙස කටයුතු කළයුතු වීම එක් ප්‍රධාන අරමුණකි.

2. පාරිභෝගිකයා සඳහා සිය සේවාවන් ඉටු කිරීමේදී ගතවන කාලය අවම අගයක් පවත්වාගත යුතුව ඇත. සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාෂන මධ්‍යස්ථානයට සේවා ලබා ගැනීමට එන ඔබට ඔබගේ භාණ්ඩ ඔබ අතට පත් වන විට ප්‍රධාන සේවා කවුළු තුනක් පසුකර යා යුතුය. ඒ ඒ ස්ථානවලදී අදාල රාජකාරී සිදුවෙයි. ඒ අනුව විනාඩි 30 ට අඩු කාලයකදී ඔබට සිය සේවාවන් ඉටුවනු ඇත.

3. පාරිභෝගි ක පැමිණිලි 5% දක්වා අඩුකර ගැනීම සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානයේ තවත් එක් ප්‍රධාන අරමුණකි.

ඕනෑම සේවා ස්ථානයකින් සේවා සැපයීමේදී පාරිභෝගිකයින් ගේ පැමිණිලි නිරන්තරයෙන් ලැබෙනු ඇත. එසේ වන්නේ ආයතනික දුර්වලතා හේතුවෙනි. එහෙත් **ISO** 9001:2015 තත්ත්ව සහතිකය යටතේ එවැනි අඩුපාඩු තබා ගත නොහැකි. එලෙස පාරිභෝගික පැමිණිලි 5% ට වඩා අඩුවෙන් තිබිය යුතුය. එසේ පවත්වාගෙන යෑමට කාර්ය මණ්ඩලය උපරිම කැපවීමෙන් කටයුතු කරති.

එසේ ජාත්‍යන්තර පිළි ගැනීම ලැබීමෙන් පසුද එම තත්ත්වයෙන්ම සිදුවන්නේද යන්න ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය හරහා පසු විපරම් සිදු කරයි. වසර තුනකට වරක් මෙම සහතිකය නිකුත් කරන අතර එම කාලය තුළ ද වසරකට වරක් පූර්ණ අධීක්ෂණයට භාජනය කිරීම සිදුවෙයි. මීට අමතරව ආයතනය මගින් වෙනම කාර්ය මණ්ඩලයක් යටතේ අභ්‍යන්තර විගනනයක් නිරන්තරයෙන් සිදුකරති.

මෙවැනි කඩඉම් රැසක් පසුකර ලබා ගත් **ISO** 9001:2015 ප්‍රමිති සහතිකය ඊළඟ වසර සඳහාද රැක ගැනීමට නම් එම මට්ටමින්ම ආයතනය පවත්වාගෙන යෑම ආයතනයේ වගකීමයි.

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානය එළෙස අඛණ්ඩව වසර 12 ක් පුරාවට **ISO** ප්‍රමිති සහතිකය ලබාගත් ආයතනයක් වීම විශිෂ්ටය.

ප්‍රධාන වශයෙන් මෙම ආයතනයට පැමිණෙන්නේ විදේශගත වූ ලාංකිකයින් එම රටින් ලංකාවට ගෙන ආ බඩු භාණ්ඩ නිදහස් කරගැනීම උදෙසාය.

ඒ පිරිස් අතර තම භාණ්ඩ නිදහස් කරගැනීම පිළිබඳ අවබෝධය ඇති අයත් නැති අයත් සිටිති. මේ සැමටම එක සමාන ලෙස සේවා සහ පහසුකම් සැපයීම ආයතනයේ හා සේවක සේවිකාවන්ගේ වගකීම හා යුතුකම වනු ඇත.

පළමුව මෙම ස්ථානයට පැමිණෙන සේවාලාභියාට අනු පිළිවෙලින් අංකයක් ලැබෙන අතර ඒ අයගේ විදේශ ගමන් බලපත්‍රය හා අදාළ ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතනික සේවක සේවිකාවන් අතින් ඉතිරි රාජකාරී සියල්ල සිදුවෙයි.

අදාළ පෝරම පුරවා තමාට අයත් භාණ්ඩ හෝ බඩු පෙට්ටි නිසි ලෙස හඳුනාගැනීම සිදුකිරීමෙන් අනතුරුව භාණ්ඩ නිදහස් කරගැනීමේ ලේඛනය අදාළ පුද්ගලයා වෙත ලැබෙනු ඇත. මේ සඳහා ගතවන උපරිම කාලය විනාඩි 30 ක් තරම් කෙටි කාලයකි.

විදේශ රටක සිට එන භාණ්ඩ පෙට්ටි දහස් ගණනක්, සේවාලාභීන් දහස් ගණනක් අතුරින් තම භාණ්ඩ නිසි ලෙස හඳුනාගෙන නිසි ආරක්ෂාව යටතේ නීත්‍යානුකූල ලියවිලි රැසක් නිසි ප්‍රමිතියට සකස් කොට සේවාලාභියා ගේ මූලික අවශ්‍යතාව විනාඩි 30 තරම් කෙටි කාලයකින් ලබාදීම යනු සුළු පටු කාර්යක් නොවේ. මෙම කාලය තුළ සිදුවන සියලු ක්‍රියා කාරකම් සඳහා සේවාලාභියා කිසිඳු වෙහෙසකට පත්වීමට ඉඩ නැත. ඔහුට ඇත්තේ නම සහ අංකය කියා අමතන තෙක් බලා සිටීම පමණි.

ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව සේවාලාභියාට උපරිම සේවාවක් ලබාදීම තුළ සැමවිටම සිදුවන්නේ සේවාලාභියාගේ අවශ්‍යතාව ඉතා ඉක්මනින් හා නිවැරදිව ඉටුකර දීමයි.

ඊළඟට සේවාලාභියා ගේ භාණ්ඩ සඳහා ආයතනය පූර්ණ ආරක්ෂාව සළසයි. යම් විදියකින් කුමන හෝ කැඩීමක් බිඳීමක් හානියක් සිදුවී ඇත්නම් ඒ සඳහා රක්ෂණ ආයතනයේ නීති හා රෙගුලාසිවලට යටත්ව පූර්ණ රක්ෂනාවරණයක් හිමි වනු ඇත. තමා ඉදිරිපිට සියලු භාණ්ඩ රේගු පරීක්ෂාවට ලක්වන අතර එවැනි හානි පැමිණිළි යම් භාණ්ඩ ඇත්නම් ඒ ගැන එම අවස්ථාවේදීම පැමිණිලි කළ යුතුය.

සේවාලාභියා කුමන හෝ ආපහසුතාවකට පත් නොවන අයුරින් සියලු සේවාවන් ඉටුකර දීමේ පූර්ණ වගකීමෙන් යුක්තව කටයුතු කිරීම සිලෝන් ෂිපිං ලයින්ස් සමාගමේ පරමාදර්ශය වන අතර ඒ නිසාම අඛණ්ඩව **ISO** 9001:2015 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය මගින් පෙන්නුම් කරන ප්‍රමිතිය පවත්වා ගැනීම සිදුකරයි. ලොව කොතනක හෝ රටකදී ඉතා උසස් තත්ත්වයේ භාණ්ඩ නිශ්කාශන ආයතනයකට ඔබ ගිය ද එම තැනකින් ලැබෙන උපරිම සේවාව ඔබට ශ්‍රී ලංකාවේදී සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාශන මධ්‍යස්ථානයේ දීද හිමි වනු ඇත.

දැනට ලංකාවේ ඇති **ISO** සම්මානය දිනාගත් එකම භාණ්ඩ නිශ්කාශන සමාගම බවට පත්වී ඇත්තේද සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානයයි.











**ලංකාවේ භූ විෂමතාවට අනුව ලංකා පොලෝ තලය මධ්‍ය කොටස උසින් පිහිටා ඇත. එය ස්වභාව ධර්මය විසින් ලංකාවාසීන්ට ලබා දුන් දායාදයකි. කඳු ගිරි ශිඛර වන තුරු ලතා ආදියෙන් පෝෂිත මෙම පරිසරය දිය උල්පත් විශාල වශයෙන් පිහිටි ප්‍රදේශයකි. මෙම පරිසරය විනාශ වුවහොත් ලංකාවට ජලය අහිමි වෙයි.**



බේකර්ස් වංගුව

# අශ්ව ලාඩමක හැඩයෙන් හැදූ බේකර්ස් වංගුව




මධ්‍ය කඳුකරයේ පහළ කොටස තැනිතලා සශ්‍රීක පසක් පිහිටා ඇත. ඉහළ කඳුකරයේ දිරා වේලී යන කාබනික පොහොර ජලයේ දියවී පහළට ගලා ඒම නිසා කාබනික පොහොරින් තැනිතලා තෙත් බිම් සරුසාර වෙයි. ජලය පොහොර තද හිරු රැස් ඇති නම් කෘෂි භෝග වගාව සඳහා වෙනත් කිසිවක් අවශ්‍ය නොවේ. මෙය මනාව තේරුම් ගත් ආදී සිංහලයා මධ්‍ය කඳුකරය ඉහළ කොටසේ ජලය හා කාබනික පොහොර ගබඩාවක් වශයෙන් ඉතිරි කරගෙන පහළ බිම් වගා කටයුතු සඳහා යොදා ගත්හ. ඉහළ ප්‍රදේශ වලට ඔවුන් ජන ව්‍යාප්තිය සිදු කළේ නැත. එසේ වූවා නම් විශාල විනාශයක් සිදු වනු ඇත. ඔවුන් ගංගා මිටියාවත් හා වැහි වතුර කළමනාකරණය කර ගනිමින් රටම පෙරදිග ධාන්‍යාගාරයක් බවට පත් කළහ.

සුද්ද ලංකාව ආක්‍රමණය කළ පසු මුලින්ම අත තිබ්බේ මධ්‍ය කඳුකරයෙන් ඉහළටය. එහි තිබූ අවුරුදු දස දහස් ගනනක් පැරණි වනාන්තර කපා ගිනි තබා විනාශ කළේය.

ඔවුන්ට අවශ්‍ය වුනේ කෙටි කාලයක් තුළ ඉක්මන් ආදායම් ඉපයීමේ ව්‍යාපාරය. ඒ නිසා ඉහළ කඳුකරයට රිංගූ සුද්දන්ට කඳු හෙල් ගිරිශිඛර මිටියාවත් සානු "මැණික්" වගේය. එක එක සුද්දා රිංගපු තැන් ඒ ඒ සුද්දාගේ නමින් නම් කළහ. ඔවුන් ජීවත් වූ වසර 150 ක තරම් කාලය තුළ මේ රටේ සාරය උරා ගන්නේ වර්තමානයේ සිටින අපිට දරා ගත නොහැකි ප්‍රශ්න ගොඩක් ඉතිරි කර දමාය. අද නාය යෑම යන දුක්මුසු කටෝර අත්දැකීමට ජනයාට මුහුණ දීමට සිදුවී ඇත්තේ මේ මධ්‍ය කඳුකරය අත්පත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

කෙසේ නමුත් ලංකාවම සුන්දර රටක් බව අවිවාදිතය. මධ්‍ය කඳුකරය හා ඉහළ කඳුකරය කොහොමත් සුන්දරය. සුද්දා පදිංචිව සිටි ප්‍රදේශත් ඔවුන්ගේ අවධානයට ලක්වූ විශේෂ තැනුත් අද වර්තමාන සමාජයට ද ආකර්ශනීය ස්ථාන බවට පත්වී ඇත.

අද එම ස්ථාන කෘතිමව තනා ඇති ස්ථාන බවට පත්වී ඇත. විසල් වනාන්තර අද තේ වතු බවට පත්වී ඇත. ආවේනික තුරු ලතාවන් වෙනුවට ෆයිනස් වනාන්තර දැක ගත හැක. මේවා ස්වාභාවික වනාන්තර වශයෙන්ම තිබුණා නම් කොයිතරම් වටිනාකමක් ලැබෙනු ඇද්ද?



බේකර්ස් වංගුවේ සිට මාර්ග පෙනෙන අයුරු

එහෙත් අද අපි වර්තමානයේ එහි තිබූ සොබාසිරියේ අඩක් දැක බලා සතුටු වෙමු. මේ ප්‍රදේශ වලට එකල සුදු ජාතිකයින් ඇතුල් වූයේ අතිශය දුෂ්කරතා විදිමිනි. අද ද එහි ඇති ගමන් මාර්ග වල දුෂ්කරතාව දකින විට අදින් වසර 200 ට පමණ ඉහත දී මෙම ප්‍රදේශ කෙසේ තිබෙන්නට ඇත්දැයි සිතාගත හැකිද?

11 වෙනි පිටුවට ...

10 වෙනි පිටුවෙන් ...

# බේකර්ස් වංගුව ...

හෝර්ටන් තැන්න අතිශය සුන්දර තැනකි. විනාශ වූ පරිසරයක් තුළ මෙසේ නම් එදා මීටත් වඩා සුන්දර තැනක් වන්නට ඇත. හෝර්ටන් තැන්නට ඇතුළුවීමට ඇති මාර්ග 6 කි. නුවරඑළිය සිට අඹේවෙල හරහා පට්ටිපොල පිවිසුම එකකි. හපුතලේ බොරලන්ද හරහා ඔහිය පිවිසුම තවත් එකක්. මීට පෙර මෙම පිවිසුම් දෙකට අමතරව තවත් මාර්ග 4 ක් තිබී ඇත. බෙලිහුල්ඔය සිට නන්පේරියල් මාර්ගය මේ මාර්ග අතරින් කෙටිම මාර්ගයයි. බගවන්තලාව මාර්ගයත් ජයගම සහ ඔහිය පට්ටිපොල අතර දුම්රිය මග ඔස්සේ ද අඩිපාරක් ඇත. කෙසේ නමුත් මාර්ග 6 ක් තිබූ අතර අද භාවිතා නොවන මාර්ග හතරම තහනම් කොට ඇත. සංචාරකයින්ගේ නොමනා හැසිරීම අනවසර පතල් කර්මාන්ත නොමනා ක්‍රියා මෙම ප්‍රදේශවල සිදු වීම වැළැක්වීම සඳහා මෙම මාර්ග වසා ඇත. මෙම ප්‍රවේශ මාර්ග ඔස්සේ වර්තමානයේ ඇතැම් පිරිස් ගමන් ගන්නා නමුත් එය සම්පූර්ණයෙන්ම නීති විරෝධී බව වන ජීවී දෙපාර්තමේන්තුව පවසයි.

අනෙකුත් මාර්ග බොහෝමයක් වල්වැදී වැසී ගොස් ඇති අතර එහෙත් අනවසරයෙන් රහසිගතව මෙම මාර්ග ඔස්සේ ඇතුවන පිරිස් සිටිති. එහෙත් මෙම මාර්ග ඔස්සේ ගමන් කිරීම අතිශය භයානකය. දඩයක්කරුවන් බඳින ලද තුවක්කු මෙම ප්‍රදේශ වල ඇති අතර මැද ගෝනුන් මුවන් ඌරන් වලසුන් වැනි භයානක සතුන්ද සිටිති.



> **ගල ගම ඇල්ල යන හෝර්ටන් තැන්නේ සිට බේකර්ස් ඇල්ල මගින් ගලන දිය පහරයි. බෙලිහුල් ඔය නිර්මාණය වන මෙම දිය පහර ගිරි දුර්ග ඔස්සේ ගලා බසියි. එතැන් සිට පහළට අඩි 2000 ක් පමණ එනවිට එනම් මුහුදු මට්ටමේ සිට අඩි 5000 සීමාවේදී බේකර්ස් වංගුව හමුවෙයි.**

බේකර්ස් ආණ්ඩුකාරයා හෝර්ටන් තැන්නේ විසූ අලි ඇතුන් දහස් ගනන් මැරූ පුද්ගලයෙකු බව ප්‍රසිද්ධය. ඔහු විනෝදය සඳහා අලි ඇතුන් ඝාතනය කළහ. බේකර්ස් ඇල්ල මුලින්ම හමුවූයේ බේකර්ස් ආණ්ඩුකාරවරයාටය. ඊට පෙර තවත් අයට හමුවන්නට ඇත. එහෙත් ජනතාව අතර ප්‍රසිද්ධ වන්නේ ඔහුට හමුවීමෙන් පසුවය. මොහු මෙම ප්‍රදේශයේ විසූ අයෙකි. ඒ අවට තේ වතු විශාල වශයෙන් වගා කළ ඔහු නමින් බේකර්ස් නමින් වංගුවක් ද ඇත.

එකල සුද්දන් ගමන් බිමන් ගියේ අසුන් පිටය. ඒ සඳහා හොඳ ශක්තිමත් අශ්වයින් පිට රටින් ආනයනය කළේය. එකල අශ්වයෙකුගේ හිමිකරුවෙකු යනු එසේ මෙසේ පුද්ගලයෙකු නොවේ. බේකර්ස් වෙනුවෙන් හෝර්ටන් තැන්නේ ඇල්ල නම්කර ඇතුවා සේම නන්පේරියල් වත්තේ බේකර්ස් වංගුව ද පිහිටා ඇත. ඉහළ ගලගම ලඳු යායේ සිට නන්පේරියල් වෙත අසුපිටින් පැමිණි මාර්ගයේ මෙම වංගුව පිහිටා ඇත.

භාවා ගල කන්දට යන මාර්ගය බෙලිහුල්ඔය තානායම අසලින් ඉහළ ගලගමට හා ලඳුයාය ගමට යන මාර්ගය පිහිටා ඇත. ඒ යන විට ගලගම කිට්ටුවෙද්දී පිහිටි කුඹුරු යායක් සමග ඇති ෆයිනස් වනාන්තරය හරහා වැටී ඇත්තේ එදා බේකර්ස් භාවිතා කළ මාර්ගයයි. කි.මී. 5 ක් තරම් දුරකින් නන්පේරියල් වතුයායට මෙම මාර්ගය ඔස්සේ ළගාවිය හැක. ගමන දුෂ්කර නමුත් දුර ඉතා අඩුය. අදත් වතුවල කම්කරුවන් මෙම මාර්ගය භාවිතා කරති.

අතිශය සුන්දර මනරම් දර්ශනවලින් ගහණ මෙම ප්‍රදේශයට ඇත සුන්දර දසුන් දැකිය හැක. අවට පරිසරය නෙත් සිත් ඇද ගන්නා සුලු දැකුම් කලු පරිසරයකි. මෙසේ යනවිට ගලගම ඇල්ල නොහොත් කැති ගහන ඇල්ලට ද ළගාවිය හැක. එසේම බේකර්ස් වංගුවටද ළගා විය හැක. මේ වනවිට මුහුදු මට්ටමේ සිට අඩි 7000 ක තරම් උසකින් මෙම ස්ථානය පිහිටා ඇත.

ගල ගම ඇල්ල යනු හෝර්ටන් තැන්නේ සිට බේකර්ස් ඇල්ල මගින් ගලන දිය පහරයි. බෙලිහුල් ඔය නිර්මාණය වන මෙම දිය පහර ගිරි දුර්ග ඔස්සේ ගලා බසියි. එතැන් සිට පහළට අඩි 2000 ක් පමණ එනවිට එනම් මුහුදු මට්ටමේ සිට අඩි 5000 සීමාවේදී බේකර්ස් වංගුව හමුවෙයි. මෙය හමුවන්නේ නන්පේරියල් සිට නැග්රැක් බංගලාවට යන මාර්ගයයි. මෙම මාර්ගයේ 23 වන වංගුව බේකර්ස් වංගුවයි.

මෙතැන් සිට බලන්නෙකුට ආදර කන්ද බලතුඩුව හොම්මෝලියා ඇත කඳු යායක් දැකිය හැකිය. සමනල වැව ප්‍රදේශයද නැග්රැක් බංගලාව හෝර්ටන් තැන්නේ දකුණු ප්‍රදේශය ලෝකාන්තයේ පාමුල එනම් නන්පේරියල් වත්තේ උග්ගල් යන ප්‍රදේශය ඇතින් දැක ගත හැක. නන්පේරියල් වත්තේ අංශක 360 ක වපසරියක් පියවි ඇසින් දැක බලාගත හැකි අති සුන්දර දසුනකි.

මෙම මාර්ගයේ දැකිය හැකි බේකර්ස් වංගුව කොන්ක්‍රීට් යොදා අශ්ව ලාඩමක හැඩයට තනා ඇත. බේකර්ස් ආණ්ඩුකාරයාගේ අශ්වයා එතනින් පහළට වැටී ඇත. බේකර්ස් සිය ජීවිතය බේරා ගත්තද අශ්වයා මිය ගියේය. එම අශ්වයා සිහි ගැන්වීමට එම ස්ථානයේ වංගුව අශ්ව ලාඩමක හැඩයෙන් තනා ඇත. එය බේකර්ස් වංගුවයි.

---

## අල්ලපු ගෙදරට අතු නැමුණු අලිගැටපේර ගෙඩි කඩන්න ග්‍රාමසේවකත් එක්ක ගිහින්

තම ගෙමිදුලේ වූ අලිගැටපේර ගසක පලදාව නෙළා ගැනීමට ග්‍රාමසේවක නිලධාරී සමග අල්ලපු නිවසට යාමේ අපූරු පුවතක් දකුණු පළාතේ උප නගරාසන්න නිවසකින් වාර්තා වේ.

ඉතා ආසන්නයේ පිහිටි මෙම ගෙවල් දෙක වෙන්වූයේ ඉතා උස තාප්පයකිනි. තාප්පය උස් වූයේ මේ ගෙවල් දෙකේ අය අතර කලක් තිස්සේ පැවැති නයි වෛරයක් නිසාය.

මෙහා නිවසේ ගෙමිදුලේ අලිගැට පෙර ගසක් වූ අතර එහි අතු ඉති තාප්පය ඉක්මවා ගොස් එහා පැත්තට විහිදී තිබුණි. මෙවර අලිගැට පේර පලදාව හොඳින් තිබූ අතර ගසට නැගි ගෙහිමියා දැක්කේ වැඩියෙන්ම ගෙඩි හැදී ඇත්තේ එහා පැත්තට ගිය අත්තේ බවයි. අත්ත දිගේ ඒ පැත්තට යාමට නොහැකි නිසා ඔහු ගෙඩි ටික හොඳින් පැසෙන තුරු ඇස ගසාගෙන සිටියේ මහත් තැති ගැන්මකිනි.

ගෙඩි හොඳට වැඩී ඇති බව දැනගත් ගෙහිමියා මෙම ගෙඩි කැඩීමට ග්‍රාමසේවක පිහිට පැතීය. මීට මැදිහත්වීමට මැලිකමක් දැක්වූ ග්‍රාමසේවක ඔවුන්ගේ වදේට එහි ගොස් අලිගැටපේර කඩා ගැනීමට උදවු කළත් අත්ත කපා දමන ලෙස මෙහා නිවසෙන් නියෝගයක් ලැබුණාලු.

## දෙයියෝ සාක්කි

## ලක්ෂපතියෙකු වීමට නම් ...

"ලක්ෂපතියෙකු වීමට නොවරදින ක්‍රමයක්" "රුපියල් දහයක් එවා විස්තර ලබාගන්න". යැයි පුවත්පතක දැන්වීමක් පළවී තිබුණි. මෙම දැන්වීමට විස්තර ලබා ගැනීම සඳහා රුපියල් දහයේ ඇනවුම් සමග විශාල ලිපි සංඛ්‍යාවක් එවා තිබුණි.

එම සියල්ලටම ලැබුණේ එකම පිළිතුරකි. ඔබ මාස්පතා රුපියල් දස දහස බැගින් බැංකුවේ ඉතිරි කරන්න මාස දහයකින් ඔබ ලක්ෂපතියෙකි යනුවෙනි.

## නිට්ටෑවකු කියා මනමාලිය මනමාලයාගේ මුහුණ පහුරුගාලා

මධු සමය දා රාත්‍රී නිට්ටෑවෙකු කියා මනමාලිය මනාලයාගේ මුහුණ පහුරු ගා මහා ජංජාලයක් වූ පුවතක් මහනුවරට තාදාසන්න හෝටලයකින් වාර්තා විය. මංගල යෝජනාවකින් විවාහපත්වූ ඔහු පෞද්ගලික ආයතනයක විධායක ශ්‍රේණියේ රැකියාවක නියුතු වූවකු වන අතර ඇය රජයේ රැකියාවක නියුතු රූමත් තරුණියක වූවාය.

අනුරාධපුර ප්‍රදේශයේ හෝටලයක විවාහ මංගලොත්සවය පවත්වා මධුසමය ගත කිරීමට දෙදෙනාගේ එකඟතාව මත තෝරාගෙන ඇත්තේ මහනුවරට තදාසන්නයේ පිහිටි හෝටලයකි. රාත්‍රී භෝජනයෙන් පසු දෙදෙනා ඔවුන්ගේ ලෝකයේ තනිවූ අතර මධ්‍යම රාත්‍රිය ඉක්මයත්ම මනාලයා මුලු හෝටලයම දෙවනත් කරමින් කෑ ගසා මුහුණේ ලේ පෙරන තුවාල සහිතව පිළිගැනීමේ කවුන්ටරය වෙත දුවවිත් ඇත්තේ තම නිදි ඇඳුම පිටින්මය. අනපේක්ෂිතව ඇතිවූ මෙම තත්ත්වය මත හෝටල් කාර්ය මණ්ඩලයද කලබලවී කරුණු කාරණා සොයා බැලීමේදී හෙළිවී ඇත්තේ මනාලිය නින්දේ පසුවෙද්දී තමා හීනෙන් නිට්ටෑවෙකුගේ ග්‍රහණයට හසුවූ බැවින් බව දැනී උගෙන් බේරීම සඳහා ප්‍රහාර එල්ල කර ඇති බවකි.

## ලයිට් ගිය අස්සේ පැණි වළලු වෙනුවට මදුරු දඟර කාලා

මතින් පදම් වී සිටිඅයෙකු රාත්‍රියේ අසල තේ කඩයකට ගොඩ වූයේ උණු තේ කෝප්පයක් බීමටය.

තේ කඩයේ හිමිකාරිය මැදිවියේ කාන්තාවකි. ඔහු කඩයට ගොඩ වන විට විදුලිය විසන්ධි වී තිබුණි. කඩය ආලෝකවත් කිරීමට යාන්තමට ඉටිපන්දමක් දල්වා තිබුණි.



ඔහු කඩය හිමි කාන්තාව අමතා "අක්කේ පැණි වළල්ලයි... ටී යාරයයි" යැයි පවසා ඇත. කාන්තාව මුලින් පැණි වළල්ලක් දීසියක දමා ගෙනවිත් තබා පසුව කිරි තේ කෝප්පයක් ගෙනවිත් දී ඇත. තේ පානය කළ තරුණයා අදාළ මුදල ගෙවා පිටව ගියේය. ඊට ටික වේලාවකට පසුව විදුලිය ලැබී ඇත. මේසය අස් කිරීමට පැමිණි කඩ හිමි කාන්තාව තමන් මදුරුවන් සඳහා දන්වා තිබූ මදුරු දඟරව අතුරුදන් වී ඇති බව දැක අන්දුන් කුන්දුන් වූවාය. කෙසේ වෙතත් දීසිය මත ඉතිරිව තිබූ පැණි වළල්ල දැක ඇයට කාරණය අවබෝධ වී තිබේ. තරුණයා පැණි වලල්ල බව සිතා මදුරු දගරය කා ඇති බව ඇයට අවබෝධ වී තිබේ.

ඔහු රෝහල් ගත කර ඇති බව ඇයට පසුව දැන ගන්නට ලැබී ඇත.


CEYLON SHIPPING LINES LTD
SPECIAL RATES ON COURIER PACKAGES
WE HAVE SPECIAL RATES FOR BELOW COUNTRIES
AUSTRALIA
CANADA
USA
NEW ZEALAND
GERMANY
UK
GEORGIA
BELGIUM
SPAIN
Ceylon Shipping Lines LTD
No. 450, D. R. Wijewardena
Mawatha,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Call us now for the attractive rates,
M :- 0772672970
0773572835
0773561210
E :- csltravels@sltnet.lk

# රුධිර වාර්තාව අපිම කියවමු.



වර්තමානයේ සාමාන්‍ය ලෙඩකට පවා වෛද්‍යවරයෙකු මුණ ගැසුණ විට රුධිර වාර්තාවක් රැගෙන එන්න යැයි පැවසීම සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත.

"ලේ රිපෝට් එකක් අරන් බලමු." සමහර වෛද්‍යවරු එසේ කියති.

"බ්ලඩ් ටෙස්ට් එකක් කරල බලමු." තවත් අය එසේ කියති.

රෝගියා රසායනාගාරයකට පැමිණ රුධිර සාම්පලයක් ලබා දීමෙන් පසු දිග වාර්තාවක් ලබා දෙයි. එහි ඇති අන්තර්ගතය කියවා තේරුම් ගැනීම හැමෝටම හැකි කාර්යයක් නොවේ.

එහි ඇති අන්තර්ගතය තමාටම බලා ගත හැකි නම් කොතරම් හොඳද?

මේ ලිපිය කියවීමෙන් පසු ඔබට එය කළ හැක.

මෙම වාර්තාවේ ඉහළින් රෝගියාගේ නම රසායනාගාරයේ විස්තර සමහර විට වෛද්‍යවරයාගේ නමද ඇතුළත් කිරීමෙන් පසු පහත කාරණා හතරක් යොදා ඇත.

1. පරීක්ෂණ නාමය (Test)
2. පරීක්ෂනය ප්‍රතිඵලය (Result)
3. ප්‍රතිඵලයට අදාල ඒකක (Unit)
4. එම පරීක්ෂකාගාරය එම පරීක්ෂාව සඳහා දෙන අගයන්ගේ පරාසය (Normal Range) අනතුරුව මේ යටතේ ඉංග්‍රීසි අකුරු භාවිතයෙන් පහත විස්තර දක්වා ඇත.

## Hb

ඉංගීසි කැපිටල් H අකුර හා සිම්පල් b අකුර මගින් දක්වා ඇත්තේ හිමෝග්ලොබින් (Himoglobin) ප්‍රමාණය දැක්වීමයි. රුධිරයේ හිමෝග්ලොබින් අගය ස්ත්‍රී පුරුෂ අනුව දක්වා ඇත. එයට හේතුව පිරිමින් ගේ හා කාන්තාවන්ගේ හිමෝග්ලොබින් අගය වෙනස් නිසාය.

ඩෙසි ලීටරයකට ඇති ග්‍රෑම් ප්‍රමානය (g/dl) ලෙස ගණනය කරයි. වැඩිහිටි පිරිමියෙකුගේ 13-16 (g/dl) ත් අතර ප්‍රමාණයක්ද වැඩිහිටි කාන්තාවකගේ 12-15 (g/dl) ත් අතර පැවතීම නිරෝගී බවේ ලක්ෂණයකි. මෙම අගයන් මීට වඩා පහත වැටී ඇත්නම් ඒ රක්තහීනතාවය විය හැක.

## WBC මෙලෙස දක්වා ඇත්තේ සුදු රුධිරානුය.

ලේ වල ඇති මුලු සුදු රුධිරානු ප්‍රමාණය මයික්‍රෝ ලීටරයකට ඇති සෛල ප්‍රමාණය වශයෙන් රුධිර වාර්තාවේ දක්වයි. එය 4000-11000 අතර පැවතිය යුතු අතර මෙම අගයන් ඉහළ ගොස් ඇත්නම් බැක්ටීරියා අසාදනයක් විය හැකි බවට අනුමාන කළ හැක.

## ප්ලේට්ලට් (Platelets)

රුධිර පට්ටිකා ගැන මෙයින් කියවෙයි. රුධිර වාර්තාවේ එය දක්වන්නේ මයික්‍රෝ ලීටරයකට ඇති රුධිර පට්ටිකා ප්‍රමානය වශයෙනි. එහි සාමාන්‍ය අගය වන්නේ මයික්‍රෝ ලීටරයකට 1,50,000 - 4,50,000 ත් අතර ප්‍රමාණයකි. විශේෂයෙන් ඩෙංගු රෝගයේදී සිදුවන්නේ රුධිර පට්ටිකා අඩුවී යෑමයි. ඩෙංගු රෝගීන්ගේ නිරන්තරයෙන් රුධිරය ලබාගනිමින් පරීක්ෂා කරනු ලබන්නේ මෙම රුධිර පට්ටිකා ප්‍රමාණය කොපමන මට්ටමක ඇද්ද යන්නයි.

## DLC (Differential Lecckocyte Count)

මෙයින් අදහස් කරන්නේ විශේෂිත සුදු රුධිරානු ප්‍රමාණය යන්නයි. සුදු රුධිරානුවල වර්ග ගණනාවක් ඇත. ඒවායේ අඩු වැඩි වීම් අනුව රෝග තත්ත්වයන් හඳුනාගත හැක.

බැක්ටීරියා අසාදනවලදී නියුට්‍රොෆිල ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා අතර වෛරස් අසාදන වලදී වසා සෛල ඉහළ අගයක් ගනී මෙය වෛද්‍ය වාර්තාවල දක්වන්නේ මුලු සුදු රුධිරානු සෛල ප්‍රමානයේ ප්‍රතිශතයක් ලෙසිනි.

| | |
|---|---|
| Neutrophils | 40-70% |
| Bands | 0-5% |
| Lymphocytes | 20-50% |
| Monocytes | 4-8% |
| Eosinophils | 0-6% |
| Basophils | 0-2% |

මෙහි බෑන්ඩ්ස් ලෙස දක්වා ඇත්තේ නොමේරූ සුදු රුධිරානුය. මෙම ප්‍රමාණය ඉහළ අගයක් දක්වා ඇත්නම් මෙයින් අදහස් කරන්නේ යම් ආසාදන තත්ත්වයකි. ආසාදනවලදී ඇටමිදුලු වලින් සුදු රුධිරානු නිපදවීම වැඩිවෙයි.




## R.B.C. Indices

මෙයින් විමසා බලන්නේ රතු රුධිරානුවල විවිධ ගුණාංගයන්ය. රක්ත හීනතාවයේදී ඒ සඳහා හේතු සොයා ගැනීමට මෙය උපකාරී වේ.

R.B.C. (Red Blood Count) රතු රුධිරානු වල ප්‍රමාණය මෙමගින් බලයි. පුරුෂයෙකුගේ මයික්‍රෝ ලීටරයට සෛල මිලියන 4.5 ත් 6.5 ත් අතර තිබිය යුතුය. කාන්තාවකගේ නම් 4.0 ත් 5.5 ත් අතර ප්‍රමාණයකින් තිබිය යුතුය.

## HCT

මෙසේ දක්වන්නේ රුධිරයේ සෛල ප්‍රතිශතයයි. පිරිමියෙකුගේ 39-47% ත් අතර විය යුතු අතර කාන්තාවක ගේ නම් 35-45% අතර විය යුතුය.

## MCH (Mean Corpuscular Hemoglobing)

මෙයින් දක්වන්නේ එක රතුරුධිරානුවක ඇති හිමෝග්ලොබින් ප්‍රමාණයයි. එය ගන්නේ එක සෛලයකට පිකෝ ග්‍රෑම් (Pg/cell) පරාසය 27-32 Pg/cell වශයෙනි. යකඩ ඌනතාවයේදී මෙම අගය පහල අගයක් ගනී.

## MCHC (Mean Corpuscular Hemoglobin Concentration)

එක් රතු රුධිරානුවක් සඳහා හිමෝග්ලොබින් සාන්ද්‍රණය මෙම දර්ශකය මගින් ලබාදෙයි. එහි සාමාන්‍ය අගය ඩෙසි ලීටරයට ග්‍රෑම් 32-36 අතර අගයක පැවැතිය යුතුය.

**Reticulocyte Count** රුධිරයේ ඇති නොමේරූ රතු රුධිරානු ප්‍රමාණයයි. මුලු රතු රුධිරානු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කර අගය ලබාගනී. එය 0.8 - 2.5% ක් අතර තිබිය යුතුය. යම් හේතුවක් නිසා රතු රුධිරානු විනාශවීමක් හෝ රුධිර වහනයක් සිදුවුවහොත් ඇට මිදුලු වලින් රතු රුධිරානු නිපදවීම වැඩි වී නොමේරූ රතු රුධිරානු ප්‍රමාණය ඉහළ යයි. එවිට ඉහත අගයද ඉහළ යනු ඇත.

ඉහත මෙම පරීක්ෂණ සඳහා අන්වීක්ෂ හෝ කේන්ද්‍රාපසාරය වැනි මෙවලම් මගින් විශාල කාලයක් මිඩංගු කොට එකින් එක නිරීක්ෂණය කොට පරීක්ෂණ වාර්තා සදනු ලබයි. එහෙත් වර්තමානයේ ඇති දියුණු තාක්ෂණය ඔස්සේ ස්වයංක්‍රීය සෛල ගණක (Automated Cell Counter) යන්ත්‍ර මගින් විනාඩි කීපයකදී සියලු වාර්තා ගනු ලබයි.

මෙම රුධිර වාර්තාවක් මගින් සියලු රෝග නිශ්චය කළ නොහැකි නමුදු රෝග විනිශ්චය සඳහා වෛද්‍යවරායට යම් පිටුබලයක් ලැබෙන අතර මෙම වාර්තාවක් මගින් රෝගියාට ඖෂධ තීරණය කළ නොහැක. ඒ සඳහා වෛද්‍යවරයෙකුම අවශ්‍ය වනු ඇත.



# දිනෙන් දින වැඩිවන වැඩිහිටි නිවාස







**අද තරුණ පරපුර එකිනෙකාට දුරස්ව නැ කම් හිත මිත්‍රකම් ඔවුන්ට විතරක් ආවේනික පිරිස්වලට සීමා කර ගනිමින් පරම්පරා ගත ඥාති මිත්‍රාදීන් අසල්වැසියන් අමතක කර කටයුතු කරන යුගයක් බවට පත්වී ඇත. ඒ දුරස් කිරීම ඔවුන් සිදුකරන්නේ මුළු හදින්මය. එපමණක් නොව තමාට ලාභ ප්‍රයෝජන ඇති අය පමණක් ලංකර ගන්නවා මිස වැඩිහිටිකමට හෝ ඥාතිකමට හෝ කළ උපකාර වෙනුවෙන් හෝ සහ සම්බන්ධයන් පවත්වාගෙන නොයයි.**

ආර්ථිකය මූලික කරගත් සමාජ ක්‍රමයක් තුළ සමාජ පුරුෂාර්ථයන් විනාශයට ලක්වෙයි. ආර්ථිකය අතහැර සමාජ සහජීවනය තුළ ශක්තිමත් වන සමාජයන් තුළ පමණක් හොඳ නරක ගැන අවබෝධය හා ගුණ ධර්ම රදා පවතී. 1977 වසරට පෙර අප රටේ පැවැතියේ සමාජ සහජීවනය පෙරදැරි කරගත් සමාජ ක්‍රමයකි. එහිදී ගෙදර අයත් අසල්වාසීන් ගම්වාසීන් නෑදෑයින් මේ සියලු දෙනා එකිනෙකාට උදව් පදව් කරගනිමින් ඇති නැති දේ හුවමාරු කරගනිමින් සහජීවනයෙන් ජීවත් වූහ.

විවෘත්ත ආර්ථිකය අපට හඳුන්වා දුන්නාට පසු ආර්ථිකය මූලික කරගත් සමාජ ක්‍රමය ටිකෙන් ටික දියුණු වෙමින් හතලිස් වසරක් ගෙවී යන මේ අවස්ථාව වන විට උපත ලබන්නේ ඒ විවෘත්ත ආර්ථිකයේ සුජාත දරුවන්ය. වයස අවුරුදු 50 ක් පැනපු අයට මේ දෙකේ වෙනස පැහැදිළිව පෙනෙන බැවින් ඔවුන් දැඩි මානසික ව්‍යාධියකට පත්ව සිටිති.

අද තරුණ පරපුර එකිනෙකාට දුරස්ව නැකම් හිත මිත්‍රකම් ඔවුන්ට විතරක් ආවේනික පිරිස්වලට සීමා කර ගනිමින් පරම්පරා ගත ඥාති මිත්‍රාදීන් අසල්වැසියන් අමතක කර කටයුතු කරන යුගයක් බවට පත්වී ඇත. ඒ දුරස් කිරීම ඔවුන් සිදු කරන්නේ මුලු හදින්මය. එපමණක් නොව තමාට ලාභ ප්‍රයෝජන ඇති අය පමණක් ලංකර ගන්නවා මිස වැඩිහිටි කමට හෝ ඥාතිකමට හෝ කළ උපකාර වෙනුවෙන් හෝ සහ සම්බන්ධයන් පවත්වාගෙන නොයයි. එහිදී දෙමාපියන්ටද සලකන්නේ එකම මිනුම් දන්ඩෙනි.

පුරාණ කාලයේ එහෙම නොවෙයි. අනෙකාට උදව් කරන්නේ උදව් බලාගෙන නොවේ. එකිනෙකා එකිනෙකාට පිහිට වෙයි. ඒ අයට මුදලට ධනයට වඩා ශක්තිමත් පිරිස් බලයක් සිටියහ. ඒ තුළ ශක්තිය අපමණය. මේ පිරිස් බලය වර්තමාන තරුණ පරපුරට ඇත්තේම නැත. අසල්වාසීයා පවා නොහඳුනන තත්ත්වයට පත්වී ඇත.

මේ හේතුව නිසා වර්තමාන සමාජය එකිනෙකා හුදකලා වී සිටිති. ලාභ ප්‍රයෝජන වෙනුවෙන් පවත්වන මිත්‍ර සම්බන්ධතාව ලාභ ප්‍රයෝජන අහිමි වීමත් සමඟ දුරස් වී යයි. විශේෂයෙන් වයසට යන විට හෝ රැකී රක්ෂා අහිමිව ආර්ථිකය බිඳ වැටෙන විට හෝ අසනීපයක් ලෙඩක් දුකක් ඇති වූ විට හෝ මිත්‍රයින් හෝ සමාජයක් ඉතිරි නොවෙයි.

ඒ රැල්ලට යන වර්තමාන පරපුරට වැඩි මහලු වූ දෙමාපියන් රැක බලා ගැනීමට අවස්ථාවක් නැත. දෙවන කරුණ ආර්ථික ප්‍රතිලාභ ගැන පමණක් සිතන මානසිකත්වයක් තුළ හැදෙන වැඩෙන දරුවන්ට දෙමාපියන් ගැන ආදරයක් සෙනෙහසක් ඉතිරි නොවෙයි. ඒ නිසා දෙමාපියන්ද වයසට ගොස් තමාට සේවය කිරීමට නොහැකි මට්ටමට පත් වූ විට ගෙදර සිටීම තමාටම කරදරයක් බවට පත්වෙයි. ඒ අනුව දෙමාපියන්ට උරුම වන්නේ මහලු මඩම මිසක් අන් කවර තැනක් ද?

මේ හේතුව නිසා ලංකාවේ මහලු මඩම් දිනෙන් දින වැඩි වෙමින් පවතී. මීට පෙර යුග වල තනිවූ පවුලේ ඥාතීන් පවා මැරෙන තුරු සෙසු ඥාතීන් බලා ගත්හ. දුරස්ත ඥාතීන් පවා තම ගෙවල් වල වයසට ගොස් සිටියහ. පියා පියාගේ මව් පියන් පවා එකල මැරෙන තුරු විසුවේ එක ගෙදරය එහිදී බැරි කෙනාව පුලුවන් කෙනා විසින් රැක බලා ගත්තේ ලාභ ප්‍රයෝජනයක් නොසලකාය. වැඩිහිටි කමට සැලකුවේය. ඥාතිත්වයට සැලකුවේය. මනුෂ්‍යකමට සැලකුවේය. පුණ්‍ය කර්මයක් යැයි සිතා ඔවුහු කටයුතු කළෝය. අද ඒ එකක්වත් නැත. බැරි එකාට මහ මගදීවත් සහනයක් නැති සමාජයක් මේ වන විට ගොඩ නැගී ඇත.

මේ තත්ත්වයෙන් අත මිදීමට නම් අපි ආපසු සහජීවන සමාජ ක්‍රමයකට යා යුතුය එසේ ගොස් වසර තිහ හතලිහක් ගත කළ යුතුය.

දැනට වසර පනහට වැඩි පිරිස් ඒ පැරණි සමාජ ක්‍රමය දනී. වත්මන් පරපුර එය දන්නේ නැත. වැඩිහිටියන්ට මේ දෙකේ වෙනස තේරෙයි. ඒ නිසා හරි දේ වැරදි දේ ඔවුන් දනිති. ඒ පරපුර මිය ගිය පසු ඉතිරිවන පරපුර සිතාගන්නේ හැමදාම මෙහෙම තමයි කියාය.

අපේ වත්මන් පරපුර ආපසු යෑමට කිසි සේත් කැමති නැත. මේ පවතින සමාජ ක්‍රමය තව තවත් ඉදිරියටම වර්ධනය වනු ඇත. එසේ වර්ධනය වීමත් සමඟ ඊට සාපේක්ෂව එකිනෙකා දුරස්වීමේ වේගයද වැඩි වෙයි. දිනෙන් දින ජනතාව හුදකලා වනු ඇත. ඒ වේගයෙන්ම රටට වැඩිහිටි නිවාස අවශ්‍ය වනු ඇත. වයෝවෘද්ධ දෙමාපියන් තම දූ දරුවන් එනතුරු මහලු නිවාස වලට වී සුසුම් හෙලනු අනාගතයේ සුලබ දසුනක් වනු ඇත.



# ගහල කඟට හිස දන්දුන් හත් හැවිරිදි වීරයා

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට එරෙහිව කැරලි ගැසීමේ වරදට 1812 දී පිළිමතලව්වේ මහ අධිකාරම් රජ අණින් මරා දැමීය. ඒ වන විට ඔහුට කන්ද උඩරට විශාල ජනප්‍රසාදයක් ලැබී තිබූ අයෙකි. ඔහුට තිබූ ජන ප්‍රසාදය නිසා එම තනතුරට රජු විසින් පත් කරනු ලැබුවේ ඔහුගේම බෑණනුවන් වූ ඇහැලේපොළ නිලමේ තුමාය.

රජු ඇහැලේපොල එම තනතුරට පත් කරනු ලැබුවද රජු කෙරෙහි වෛරයක් ඇහැලේපොළට තිබුණි. එසේම රජුද ඔහු කෙරෙහි නිරන්තර සැකයෙන් කටයුතු කළේය. දෙදෙනාම එකිනෙකාට සැකය හා වෛරය පළ කළේ නමුත් එය එළිපිට නොවේ.

එම කාලයේ කන්ද උඩරට රාජ්‍යයට එරෙහිව සිංහල රඳලයින්ද ඉංග්‍රීසි ආක්‍රමණිකයින් ද රජු පලවා හැර බලය ලබා ගැනීමේ කුමන්ත්‍රණ වල යෙදී සිටියහ. රජුද දෙපැත්තකින් පීඩාවට පත්ව සිටියේය. රජුට පක්ෂ රඳල පිරිසක්ද සිටියහ. රජු තමාට පක්ෂ නොවූ පිරිස් හි රාජකාරී දුර පළාත් වලට මාරු කළහ. ඒ අනුව ඇහැළේපොළ සබරගමු පළාතට මාරු කර යැවීය.

එයට ප්‍රධානම හේතුව වූයේ 1813 දී රජුගේ දෙවන විවාහ මංගලෝත්සවයේදී ඇහැලේපොළ ලබා දුන් තෑගිභෝග රජුට ප්‍රමාණවත් නොවීමය. රජුට පක්ෂපාතී හිතවත් නිළමේවරු උසස් වටිනා දෑ තෑගි වශයෙන් ලබා දීමත් මොහුගේ ප්‍රතිචාර ප්‍රමාණවත් නොවීමත් දෙපාර්ශ්වයේ යටිහිතේ තිබූ නොහොඳ නෝක්කාඩු එළියට ඒමත් එම මංගල්‍යය තුළදී දක්නට ලැබීමය.

ඇහැලේපොළ ගේ ස්ථාන මාරුව මේ නිසා තවත් ඉක්මන් විය. සබරගමුවට පැමිණි ඇහැලේපොළ සිය රාජකාරී කළේ ප්‍රසාද සිතකින් නොවේ. සබරගමුවේ ජනයාට ඔහු අතින් තාඩන පීඩන එල්ලවූ බවද කියවෙයි.

ඇහැලේපොළ සබරගමුවේ ආචාරීවරයෙකුට රන් අසිපතක් සාදා දෙන ලෙස පැවසීය. මෙය මොල්ලිගොඩ අධිකාරමට කෙසේ හෝ දැන ගන්නට ලැබුණි. මොල්ලිගොඩ මේ ගැන රජුට කේලම කීවේ ඇහැලේපොල රජවීමේ අදහසින් රන් අසිපතක් සාදන බවයි. නමුත් ඇහැලේපොළ කීවේ මංගල්‍යයට දුන් තෑගි භෝග වල අඩුව පිරිමැසීම සඳහා වටිනා ත්‍යාගයක් රජුට ලබාදීමේ අදහසින් එය සාදන බවයි.

කෙසේ නමුත් රජු මෙම ප්‍රවෘත්තියෙන් දන්ඩෙන් පහර කෑ නාගයෙකු සේ කිපුනි. මේ ගැන විමසීමට රජු ඇහැලේපොළ මහනුවරට කැඳවීය. එසේ පැමිණියහොත් තමාට රජු මරණීය දණ්ඩනය දෙන බව දැනගත් ඇහැලේපොළ මහනුවරට පැමිණියේ නැත. ඔහු සබරගමුවේ සැගවී රජුට එරෙහිව කැරැල්ලක් සංවිධානය කළේය. ඔහු මේ සඳහා ඉංග්‍රීසීන්ගෙන් ආධාර ඉල්ලීය. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ආධාර දෙන බවට පොරොන්දු වුවත් ආධාර ලබාදුන්නේ නැත. කැරැල්ල මර්දනයට මොල්ලිගොඩ නිලමේ රජු විසින් සබරගමුවට යවන ලදී. ඒ 1814 වසරයි. මොල්ලිගොඩ කැරැල්ල මර්ධනය කළ අතර කැරලිකරුවන් 43 දෙනෙකු අල්වා රජු හමුවට ගෙන එන ලදී. ඇහැලේපොළ ඉංග්‍රීසි රැකවරණය පතා කොළඹට පැන ගියේය.

ශ්‍රී වික්‍රමරාජසිංහ ගේ ඇහැලේපොළ කෙරෙහි තිබූ වෛරය තව තවත් දැඩි විය. ඇහැලේපොළ අල්ලාගත නොහැකි වූ රජු ඔහුගේ පවුලේ උදවිය ප්‍රාණ ඇපයට ගත්තේය. ඇහැලේපොළ ගෙන් ගත නොහැකි වූ පළිය අඹු දරුවන්ගෙන් හෝ ගනිමියි සිතා රාජසිංහ කටයුතු කළේය. මෙය ලක් ඉතිහාසයේ බිහිසුනුම පළි ගැනීම විය. ලාංකේය රාජාවලියේ රජෙකු විසින් කරන ලද බිහිසුනුම අපරාධය මෙය විය.


ශ්‍රී වික්‍රම රාජසිංහ රජු


මද්දුම බණ්ඩාර

**ඇහැලේපොල කුමාරිහාමි ඇතුලු දරුවන් සිවුදෙනා මරා දමන ලෙස ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අණ කළේය. දිනය හරියටම 1814 මැයි මස 17 වනදාය. දහස් ගණන් ජනයා බෝගම්බර පිටියට ගෙන්වන ලදී. ස්ථානය මහ දේවාලයටත් නාථ දේවාලයටත් අතර පිහිටි දේවසංහිඳ නැමැති ස්ථානයයි.**

ඇහැලේපොල කුමාරිහාමි ඇතුලු දරුවන් සිවුදෙනා මරා දමන ලෙස ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අණ කළේය. දිනය හරියටම 1814 මැයි මස 17 වනදාය. දහස් ගණන් ජනයා බෝගම්බර පිටියට ගෙන්වන ලදී. ස්ථානය මහ දේවාලයටත් නාථ දේවාලයටත් අතර පිහිටි දේවසංහිඳ නැමැති ස්ථානයයි. කුමාරිහාමි හා දරුවන් සිවුදෙනා එතනට කැඳවන ලදී. ඇහැලේපොළ කුමාරිහාමි සිය නිර්දෝෂීභාවය රජු ඉදිරියේ කියා පෑවත් රජුගේ තීන්දුව වෙනස් වූයේ නැත.

එවිට ඇය ප්‍රකාශ කළේ තමන් ඇතුලු පිරිස මරා දැමීමෙන් තම ස්වාමියාට යම් අභිවෘද්ධියක් වේ නම් තමා පමණක් මරා දමා අසරණ දරුවන් නිදහස් කරන ලෙසයි. එම ඉල්ලීමද රජු නොපිළිගත්තේය. රජුගේ තීන්දුව වෙනස් නොවීය.

ගහලයා සිය කඩුව අමෝරා ගෙන ඉදිරියට පැමිණියේය. කුමාරිහාමි එකොලොස් හැවිරිදි ලොකු පුතුට කීවේ පළමුව කඩුවට ගෙලපාන ලෙසිනි. ගහලයා ළඟට එන විට ඔහු බියෙන් තැති ගෙන මර බියෙන් මවගේ සාරි පොටේ එල්ලිනි. ඒ සමගම ඉදිරියට ආ නව හැවිරිදි දෙවන පුත් මද්දුම බණ්ඩාර


ඇහැලේපොල නිළමේ


"අයියන්ඩි බිය නොවන්න මැරෙනහැටි මම පෙන්වමි" පවසමින් ගහලයාට සිය ගෙල පෑය. බලා සිටි දහස් ගණන් ජනයා භීතියෙන් වේදනාවෙන් කම්පාවට පත්වූහ. ගහලයා සිය රාජකාරිය ඉටු කළේය. ඊළඟට වැඩිමල් දරුවාගේත් තුන්වන ගැහැනු දරුවාගේ ද හතරවැනි ගැහැනු දරුවාගේද හිස් කඩින් වෙන් කළහ. ඒ වන විට සිවුවන දරුවා මවගෙන් කිරි උරා බොමින් සිටි බවත් ගහලයා දරුවා අහකට ඇද බෙල්ල කපා දැමූ බවත් සමකාලීන වාර්තා වල දැක්වේ.

සිය ගණන් ජනයා මෙම සිද්ධියෙන් විලාප නගමින් දෙවියන් යදිමින් සිතින් රජුට සාප කරමින් බලා සිටියදී ශ්‍රී වික්‍රම රාජසිංහ පත්තිරිප්පුවේ සිට සිනහ මුහුණින් යුතුව සතුටින් මෙම බිහිසුනු ක්‍රියාව බලා සිටි බවට ඇසින් දුටු වාර්තා වල දැක්වෙයි. මේ අවස්ථාවේ රාජකාරී වල යෙදී සිටි පළිපාන දිසාව සිහි මූර්ජාවී වැටී ඇත. මෙය ඔහුගේ දුර්වල කමක් සේ ප්‍රකාශ කළ රජු ඔහු සේවයෙන් පහ කළේය.

මෙම සිද්ධියෙන් මුළු රටම කම්පාවට පත් කළේය. උඩරට ජනතාවට මෙය මහත් සේ දැනුනි. ජනයා ශෝකාලාප කීය. ඇසූ දුටු ජනයා දින ගනන් නිදි මරා ශෝකයෙන් ගෙවූහ. ශෝක කාලයක් ප්‍රකාශ නොකළත් ජනතාව හදවතින් හඩා වැටෙමින් දින ගනන් ශෝක වූහ.

මේ සිද්ධියෙන් ජනතාව හා රජු අතර පරතරය තව තවත් වැඩිවිය. විශේෂයෙන් රදළයින් රජුගෙන් දුරස් වූහ. රජුට පක්ෂපාතීව සිටි පිරිස් පවා මෙම සිද්ධියෙන් රජු කෙරෙහි අප්‍රසාදය ඇති කරගත්හ. පසුව රජු ඇහැළේපොල සෙසු ඥාතීන් ගෙන් පවා රහසේ පළිගත්තේය. ඔවුන් මරා දැමීය.

මද්දුම බණ්ඩාර නව හැවිරිදි දරුවා නිර්භීතව ගහලයා ඉදිරියට පැන සිය ජීවිතය පිදීමට තරම් චිත්ත ධෛර්යක් කෙසේ උපන්නේද? ඒ නිසාම ඔහු අදටත් ජාතික වීරයෙකු වශයෙන් රට පිළි ගනිති. මෙම නිර්භීත ක්‍රියාව කරණකොට ඒ රජුගේ අමානුෂික ක්‍රියාව තව තවත් අදම ක්‍රියාවක් බවට පත්විය. ලාංකීය ඉතිහාසයේ කිසිදා අමතක නොවන පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන වීර ක්‍රියාවක් මෙම නව හැවිරිදි දරුවා විසින් කළේය. ඔහු වීරයෙකු වශයෙන් වංශ පරම්පරාව තුළ ඉදිරියට යද්දී ද්‍රෝහියෙකු ලෙස රාජසිංහ ද වංශකතාවේ ඉදිරියට දිග හැරෙයි. එම සිද්ධියෙන් වසරක් ගත වන්නටත් පෙර ශ්‍රී වික්‍රම රාජසිංහ ඉංග්‍රීසි ආණ්ඩුවේ සිරකරුවෙකු බවට පත්විය.



# සමනොළ ගිර නන්දනීය

මුනි සිරිපා වන්දනීය
සුපිහිටි මන බන්දනීය
පුදබිම ජන රංජනීය
සමනොළ ගිර නන්දනීය

විසිතුරු සමනොළ පෙදෙසේ
අසිරිය නිරතුරු පැවසේ
පෙර අද මෙන් මතු දවසේ
එය පවතී ඉර හඳසේ

සිරිපා වැඳ ඇවිද හිමේ
මුදු පවනැලි හමන සෙමේ
සිසිලස දී මුනිඳු ළැමේ
සිත රඳවයි නිවන ඉමේ

බුදු සිරිපා පහස වැදී
පිරිසිදු වූ බිමක සැදී
ගංගාවෝ සිහිල දිදී
විසිරී යති ගලා ඇදී

සිත පිනවයි ඉර සේවේ
මලුවේදී නෙතු යාවේ
සොබා දහම් සිරියාවේ
අදහස් පල ඉන් පෑමේ

සමනොල ගිරි රැකවරණේ
බුදු හිමි දැක ගත් පොරණේ
සමනොළ ගිරි වන අරණේ
නඳුන් උයනක් ඇත දෙරණේ

සිරිපා පියුමට සමවන
පියුමක් නොපිපේ කිසිදින
අමා සුවඳ ඉන් විහිදෙන
ඔසුවකි බව දුක නිමවන

**රත්නපුරේ ඩී. පියසේකර**

# සුබ නව වසරක්

සාමය සතුට සපිරුනු සුබ වසරක් වේවා
සියලූම පැතුම් ඉටු වෙන සුබ වසරක් වේවා
වාසනාව ඉස්මතුවෙන සුබ වසරක් වේවා
පතනවා සියලූ දෙනාටම සුබ වසරක් වේවා

**තිළින ලියනගේ**

# සැපත සම්පත උදාවේවා

සැලෙන සිරිමා බෝධියේ පත්
ගෙනෙන සිසලෙන් සිත් නිවේවා
මුනිඳු දළදා සමිඳු පිහිටෙන්
සියලූ ග්‍රහ දොස් දුරුව යේවා
කරන කියනා සියලූ දේවල්
සැම දෙනාගෙම සපල වේවා
ලැබූ වසරේ ලොවේ සැමටම
සැපත සම්පත උදා වේවා

තුනුරුවන් බල මහිම ලැබිලා
කැකුළු දරු පරපුර වැඩේවා
ලබන දැනුමෙන් ලොව දිනන්නට
සිව්වරම් දෙවි වර ලැබේවා
කොතන තිබුණත් කොතන පිපුණත්
මණික්, මල්වල ගුණ දනේවා
අලූත් මල් දක සතුටු විය හැකි
සිතක් සැමටම පහළ වේවා

**ශාස්ත්‍රපති පූජ්‍ය කොඩිකාරගොඩ**
**සුනීත හිමි**




# අම්මේ ඔබ මා...

අම්මේ ඔබ මා තුරුලෙ හොවාගෙන
සෙමෙන් ගයද්දී යසෝදරා වත
අම්මේ ආදර හඬ මිස වදනක්
සුව නින්දේ සිටි මට ඇසුනේ නැත.


අම්මේ ඔබගේ ඒ මුදු ස්වරයෙන්
වලාකුළක් සේ පාවී යන්නෙමි
සුරංගනා රස සිහින යළි
පිබිදෙන විට අම්මේ ඔබ මා ළඟ

අම්මේ ඔබගේ ආදර ගීතය
වන්රස ගීයක් නොඅසා ඇත්තෙමි
භවයෙන් භවයට ඒ මුදු ගීතය
ඔබේ මුවින් මට ගයන්න අම්මේ

ධර්මසිරි ගමගේ
උඩ පේරාදෙනිය



# ලෝක පුදුමයක් වූ පීසා හී ඇලවුණු කුළුණ



**ඉතාලියේ පීසා නගරයේ පිහිටා ඇති ඇලවුණු කුළුන ගැන අසා නැති කෙනෙක් නොමැති තරම්ය. පැරණි ලෝකයේ පුදුම හතෙන් එකක් ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇති මෙම කුළුන ඒ තරම්ම ප්‍රසිද්ධියක් ලබා ඇත්තේ එහි පිහිටීම නිසාය. ඇලවෙන ලෙස ගොඩනැගුවද ගොඩ නැගීමෙන් පසු ඇලවූවාද යන්න අදටත් තවමත් අභිරහසකි.**

සිරස් රේඛාවෙන් අඩි 17 ක් පිටතට පැන ඇති මෙම කුළුණේ මුදුනත ගුරුත්වකේන්ද්‍රයෙන් ද පිටතට පැන ඇත. දුටුවෙකුට පෙනී යන්නේ කොයි මොහොතේ හෝ මෙම කුළුන මහ පොලවට පතිත වීමට ඉඩ ඇතැයි කියාය. කෙසේ නමුත් එය තාමත් නිරුපද්‍රිතව පවතී.

ඉතාලියේ පීසා ප්‍රාන්තයේ අගනුවර පීසා නගරයයි. ආර්නෝ ගංගාව අසබඩ පිහිටා ඇති මෙම නගරය ලිගුරියන් මුහුදේ සිට සැතපුම් 6 ක් දුරින් පිහිටා ඇත. මෙම මුහුද මධ්‍යධරණී මුහුදේ කොටසකි. රෝම නගරයට වයඹ දෙසින් සැතපුම් 165 ක් දුරින් පිහිටා ඇති බැවින් මධ්‍ය කාලීන යුගයේ සිටම වැදගත් නගරයක් විය.

14 වන සියවසේදී පීසා විශ්ව විද්‍යාලය ඇරඹූ අතර පීසා කෞතුකාගාරය පීසා පුස්තකාලය උද්භිද උද්‍යානය ද නගරයට උතුරු දෙසින් පියසා ඩෙල්බු, ලූඩ් යන චතුරශ්‍ර ද තවත් ඓතිහාසික ගොඩනැගිලි සමූහයක්ද නිසා මෙම නගරයේ අලංකාරයත් විටිනාකමත් ඉහළ නැග ඇත.

ලෝක ප්‍රකට රෝම නෙස්කිව් දෙව්මැදුර බැප්ටිස්ටිය, කැම්පෝ සැන්ටෝව ආදියත් ඇලවුණු කුළුනත් නිසා සංචාරක ආකර්ශනය වැඩි වී ඇති අතර ලොව ප්‍රකට නගරයක් බවට පත්වී ඇත.

කි.ව. 1173 දී මෙම ගොඩනැගිල්ල ඉදිකොට ඇති අතර එය ඉදිකිරීමේ අරමුණ වී ඇත්තේ ඒ අසල පිහිටි දේවස්ථානයේ සීනුව සවිකිරීමයි. මෙම කුලුනේ නිර්මානකරුවා වී ඇත්තේ එවකට ඉතාලියේ සිටි දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වූ බොනානෝ පීසානෝය.

මෙහි අත්තිවාරම ගොඩනැගිල්ලේ විශ්කම්භයට සමාන වේ. බිත්තියේ ඝනකම අඩි 13 කි. එම ඝනකමින් භාගයක් වූ බිත්ති සහිත මහල් හයක් බිම් මහලට ඉහලින් පිහිටා ඇත. සම්පූර්ණ මහල් ගණන 8 කි. අට වන මහල විශ්කම්භයෙන් අඩුය. බිම් මහල අර්ධ කවාකාර ආරුක්කු 15 න් සමන්තවිය. ඉතිරි මහල් 6යේ ආරුක්කු 30 බැගින් ඇති අතර අට වන මහලේ ආරුක්කු 12 ක් පිහිටා ඇත. මෙම කුළුන උසින් අඩි 170 ක් වන අතර බර ටොන් 19500 ක් බවට ගණන් බලා ඇත.

**ලොව දස දෙසින් ලක්ෂ සංඛ්‍යාත සංචාරක පිරිසක් මෙම ගොඩනැගිල්ල දැක බලා ගැනීමට පැමිණෙන අතර ලොව ආකර්ශණීය නිර්මාණයකි. බොහෝ පිරිස් මේ ඇළවීම වළක්වා ගැනීමටත් අනාගතේ විනාශ නොවී තබා ගැනීමටත් විවිධ යෝජනා ඉදිරිපත් කරති. දෙවන ලෝක යුධ සමයේදී මෙම ප්‍රදේශ වල දැඩි යුධ තත්ත්වයක් පැවැති නමුත් මෙම ගොඩනැගිල්ලට යුද්ධයෙන් හානි නොවුණි.**

1173 දී ඉදිකිරීම් ඇරැඹූ බොනානෝ පිසානෝ තට්ටු තුන හමාරක වැඩ අවසන් කල අතර 1185 දී මොහු අතුරුදහන් වූ බව කියැවෙයි. කුලුනේ ඉදිකිරීම් සිදුවෙමින් ඉහළට යන විට මෙය ඇලවී ඇති බව දැකීමෙන් රාජ උදහසට ලක් වී යැයි සිතා ඔහු රටින් පැන ගොස් අතුරුදහන් වූ බවට ඇති මතද පවතී. ඒ කෙසේ නමුත් ඒ පිළිබඳ නිශ්චිත මතයක් නොපවතී. කෙසේ හෝ එයින් වසර 90 ක් යන තුරුම එහි ඉදිකිරීමක් සිදු නොවුණි.

මෙය සම්පූර්ණයෙන් කඩා දමා නැවත ගොඩනැගිල්ල ඉදිකළ යුතු යැයි බොහෝ දෙනාගේ මතය වුවත් 1275 දී තවත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු යටතේ එහි ඉදිකිරීම් ආරම්භ විය. ඔහු මුල් ශිල්පියාගේ ආකෘතියට අනුවම තවත් මහල් තුන හමාරක් ඉදිකොට සත් මහල් ප්‍රාසාදයක් ලෙස අවසන් කළේය. එහෙත් වැඩ අවසන් නොවූ අතර තවත් වසර 85 කට පසු එනම් 1355 දී අටවන මහල අවසන් කිරීමෙන් පසු කුළුනේ වැඩ අවසන් විය.

ඒ අනුව කුළුනේ වැඩ අවසන් කිරීමට වසර 180 ක් ගතවූ අතර වැඩ අවසන් වන විට කුළුන ඇලවී ගොසිනි. ඒ නිසාම "ඇලවෙන කුළුන" බවට පත්විය.

එකල ඉතාලියේ කුඩා ප්‍රාන්ත රාජ්‍යයක් ලෙස බෙදා රාජ කුමරුන් යටතේ පාලනය විය. ප්ලෝරන්ස් ප්‍රාන්තය වඩා ප්‍රසිද්ධව තිබූ පාලන ප්‍රදේශයයි. ඇලවුණු කුළුන ඉදිකිරිමෙන් පසු පීසා ප්‍රාන්තය වඩාත් ප්‍රසිද්ධියට පත්විය.

1592 දී ගැලිලියෝ ගැලිලි විද්‍යාත්මක ගණිත සිද්ධාන්තයක් සනාථ කිරීමට මෙම කුළුන උපයෝගී කරගත්තේය. බරින් අඩු හා බරින් වැඩි වස්තූන් දෙකක් උඩ සිට පහළට දැමීමේදී බරින් අඩුකුඩා වස්තුව මුලින් පොලවට පතිත වන බව ගැලිලියෝ ඉදිරිපත් කළ මතය සනාථ කළේ මෙම ගොඩනැගිල්ල මත සිට වස්තූන් දෙකක් එක විට බිම පතිත කිරීමෙනි. එම සිද්ධියෙන් එහි ප්‍රසිද්ධිය තවත් වැඩිවිය.

ජලයෙන් වැඩි වැලි සහ මැටි සහිත භූමියක් නිසා මෙය ඇලවී අතිබව කියයි. මෙහි පාදමේ දුර්වල කමක් හෝ පසෙහි ඇති දුර්වලකම හේතුවෙන් ඇලවූවා නම් මේ වන විට එය ඇද වැටීමට කාලයයි. මුල් නිර්මාණකරුවා මෙය මෙලෙසම ඇළවී තිබීමට ඉදිකළ නිසා එය එලෙසම ශක්තිමත්ව ඇතැයි සිතිය හැක.

1829 දී අඩි 15 1/2 ක් විය. 1978 දී අඩි 17 ක් ඇලවී තිබුණි. එයින් පෙනී යන්නේ මෙය ඇලවෙමින් පවතින බවයි. එසේ අලවෙන්නේ නම් එය ඉදිකිරීමේ දෝෂයකි. ඒ තරම් වේගයෙන් ඇලවන්නේ නම් එය බිම පතිත නොවන්නේ මන්ද?

ලොව දස දෙසින් ලක්ෂ සංඛ්‍යාත සංචාරක පිරිසක් මෙම ගොඩනැගිල්ල දැක බලා ගැනීමට පැමිණෙන අතර ලොව ආකර්ශනීය නිර්මාණයකි.



බොහෝ පිරිස් මේ ඇළවීම වළක්වා ගැනීමටත් අනාගතේ විනාශ නොවී තබා ගැනීමටත් විවිධ යෝජනා ඉදිරිපත් කරති. දෙවන ලෝක යුධ සමයේදී මෙම ප්‍රදේශ වල දැඩි යුධ තත්ත්වයක් පැවැති නමුත් මෙම ගොඩනැගිල්ලට යුද්ධයෙන් හානි නොවුණි.

සියල්ල ස්ථිර නොවන ලෝකයක මෙම ගොඩනැගිල්ලද කෙදිනක හෝ විනාශවීම වළක්වා ගත නොහැකි වූ නමුත් වැඩි කාලයක් එය රැකගන තබාගැනීම කාගේත් වගකීමයි.

# ආකර්ශණීය මුදලකට ගුවන් ටිකට්පත් මිලදී ගත හැක.




ඩුබායි කටාර් කුවේට් ඕමාන්

සවුදි ලන්ඩන් පැරිස් කැනඩා

ඕස්ට්‍රේලියා මාලදිවයින ඉතාලි ජපානය

## ඇතුළු ලොව ඕනෑම රටකට ගමන් කිරීම සඳහා...

## වැඩි විස්තර සඳහා අමතන්න...

**සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම,**
**450, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**
**දුරකථන : 011-2689500-8**

M - 077-2672970
077-3572835
077-3561210
E - csltravels@sltnet.lk

CSL TRAVELS

IATA ACCREDITED AGENT

# දුක කඳුලු උරුම කරගත්

# කුසුමාසන දේවිය



**ඉතිහාසගත තොරතුරු විමර්ශනය කිරීමේදී සිංහල රාජ වංශයේ රාජිනියන් පස් දෙනෙකු පිළිබඳව වාර්තා වෙයි. එයින් පළමු වැන්නිය අනුලා දේවියය. ඇය සිහසුනට පත්වන්නේ ක්‍රි.පූ. 47 වන සියවසේදීය. ඇය ලංකාවේ පමණක් නොව ආසියාකරයේම පළමු රාජිණිය වශයෙන්ද වාර්තා වෙයි. සීවලී බිසව ක්‍රි.ව. 35 දීත් ලීලාවතී බිසව ක්‍රි.ව. 1197 දීත් කල්‍යාණවතී බිසව 1202 දීත් දෝන කුසුමාසන දේවිය ක්‍රි.ව. 1581 දීත් මෙරට සිහසුන දැරූ බවට වාර්තා වෙයි. සිංහල රාජ්‍ය වංශයේ අවසාන හා ලාබාලම රාජිනිය වශයෙන් රූපශ්‍රීයෙන් අගතැන්පත් වූ තැනැත්තියක වශයෙනුත් දුක ශෝබය සන්තාපය දරාගත් සිංහල රාජ වංශයේ කඳුලු බිංදුව ලෙසින්ද ඇය හඳුන්වයි.**

ඇය රාජ්‍යත්වයට පත්වුවත් අනන්ත අප්‍රමාණ දුක් කම්කටොලු රැසක් දරා ගැනීමතින් අතිශ්‍ය ශෝචනීය දිවියක් ගෙවූ අනුවේදනීය රැජිනක් වූවාය.

ඇයට දෙමාපියන් ලබා දුන් නම වූයේ කුසුම් ආස්ථාන දෝන කතිරිනා ලෝකනාථා මහ බිසෝ බණ්ඩාර යන නාමයයි. කරලියද්ද බණ්ඩාර සහ ගලගම දෙනවක කුසුමාසන දේවියගේ පියා හා මව වූවාය. ඇයට වැඩිමහල් පිරිමි සහෝදරයෙකු හා ගැහැණු සහෝදරියක සිටි බවට වාර්තා වෙයි. වැඩිමහල් සොහොයුරා වසූරිය රෝග යෙන් මියගොස් ඇත. අනෙක් සහෝදරිය දෝන මාගරීටා කුමරිය දොන් ජුවන් ධර්මපාල රජුගේ මෙහෙසිය බවට පත්වූ බව කියවෙයි. අනතුරුව කුසුමාසන දේවියගේ මව්පියන් ද වසූරිය රෝග යෙන් මියගොස් ඇති අතර ඇගේ පියා මිය යන මොහොතේ කුසුමාසන දේවියගේ භාරකාරත්වය සිය ඥාතියෙකු වූ යමසිංහ බණ්ඩාර යන අයට පවරා ඇත. එයින් පෙනී යන්නේ කුඩා වියේ සිටම මා පිය සෙනෙහස අහිමි වූ තැනැත්තියකි. ඉන් කෙටි කලක් තුළදීම යමසිංහ බණ්ඩාර පෘතුග්‍රීසීන් ගේ ග්‍රහනයට හසුවී ගෝවට පිටුවහල් කර ඇති අතර කුසුමාසන දේවිය ගේ රැකවරණය මන්නාරමේ පදිංචිව සිටි කැතරින් ද ආබ්රූ නම් කාන්තාවකට පවරා ඇත.

**කුසුමාසන දේවිය කතෝලික උරුමකමකට හැඩ ගැසුවද දෝන කතරිනා නමින් බෞතීස්ම වුවද බෞද්ධ පුනර්ජීවනය උදෙසා ඇය මහත් කැපවීමෙන් වැඩ කළාය. මහනුවර දළදා මාලිගය ගොඩ නැගීම දළදා වහන්සේ දෙල් ගොමුවේ සිට මහනුවරට වැඩම කරවීම අදද දළදා සමිඳුන් වැඩ සිටින මැණික් ඔබ්බන ලද වටිනා අලංකාර රත්‍රං කරඬුව යටිනුවර වීදියේ රන්කරුවෙකු මගින් නිර්මාණය කරන ලද්දේ ඇය විසිනි.**

මෙය හොඳ අවස්ථාවක් ලෙස දුටු පෘතුග්‍රීසි මිෂනාරිවරුන් ඇය දෝන කතරිනා නමින් බෞතීස්ම කර ඇය පෘතුග්‍රීසි භාෂාව එම සංස්කෘතිය සිරිත් විරිත් ආදිය ඇතුව පෘතුග්‍රීසි කාන්තාවක ලෙසින් හැඩගැස්වූවා පමණක් නොව ඇගේ සිහසුනේ උරුමය දුටු ඔවුන් පෘතුග්‍රීසි සෙනෙවියෙකුට ජෝඩු කිරීමටද කටයුතු කළහ.

මේ වන විට යොවුන් වියට පත් වෙමින් සිටි කුසුමාසන දේවිය රූපශ්‍රීයෙන් අගතැන්පත් වූවාය. ඇගේ හික්මුණ ගමන් විලාශය විනීත හැසිරීම කෙරෙහි කාගේත් නෙත් සිත් ඇද බැද ගත්හ. පෘතුග්‍රීසි ආක්‍රමණිකයින් ගෝවෙන් ගෙන්වන ලද ප්‍රැන්සිස්කුද අර්සලෝස් නැමැති සෙනවියා ඇගේ ආරක්ෂාවට පත්කරන ලද්දේ ඇයව අනාගතයේ ඇගේ ස්වාමියා කරවන අදහසිනි. 1594 දී පෘතුග්‍රීසි කපිතාන් ජනරාල් පේරෝ ලෝපේස් ද සූසා යටතේ දියත් කළ උඩරට කැරැල්ලෙන් අනතුරුව කුසුමාසන දේවිය උඩරට රාජ්‍යත්වයට පත්කරන ලදී.

ඉන් අනතුරුව කපිතාන් ජෙනරාල් පේදුරු ලෝපේස් විසින් තම පුත්‍රයා වූ දියෝගුද සූසාට කුසුමාසන දේවිය විවාහ කරදීමේ උත්සාහයක් දැරූ බව ඓතිහාසික මූලාශ්‍රවල දැක්වේ. නමුත් ඇය කිසි විටකත් පෘතුග්‍රීසි කාරයෙකු විවාහ කරගැනීමටවත් ඔවුන් සමග සමීප සබධතා පැවැත්වීමටවත් උනන්දු නොවුනා පමණක් නොව පාතුග්‍රීසීන් ද බැහැර කළාය. එදා ඇය එසේ නොකලා නම් සිංහල රාජ්‍යත්වය පාතුග්‍රීසින්ට යනවා පමණක් නොව ලංකාද්වීපයද පෘතුග්‍රීසි කොළණියක් බවට පත්වීම වැළැක්විය නොහැක. එදා ඇය එසේ ගත් තීන්දුවට ලාංකීය ජනයා කෘතවේදිත්වය පළ කළ යුතුය.

ඒ වන විට 13 වන වියේ පසුවූ ඇය කොනප්පු බණ්ඩාර සමග විවාහ වූ අතර කොනප්පු බණ්ඩාර පළමුවන විමලධර්මසූරිය නමින් රජවිය. කොනප්පු බණ්ඩාරට රාජ්‍ය උරුමයක් නොතිබූ අතර කුසුමාසන දේවිය මගින් එය ලබාගත් ඔහු පෘතුග්‍රීසීන් සමග සටන් වැද මහනුවරින් ඔවුන් පළවා හැර උඩරට රාජ්‍යත්වය තහවුරු කරගත් අතර පළමු විමලධර්මසූරිය රජුගේ රණශූරත්වය හා පෘතුගීසීන්ට අත්කළ පරාජය පිළිබඳව ඉතිහාස සටන් ග්‍රන්ථවල වෙනම ලියවී ඇත.

පළමු විමලධර්ම සූරිය රජුට දාව කුසුමාසන

20 වෙනි පිටුවට ...

19 වෙනි පිටුවෙන්...

# කුසුමාසන දේවිය .....

දේවියට එක් දූ කුමරියක් සහ පුතුන් සිවු දෙනෙකු සිටි බව රාජාවලියේ සඳහන් වුවත් සූරියදේවී හා සාමාදේවිය නමින් තවත් දූ කුමරියන් දෙදෙනෙකු සිටි බවට ඓතිහාසික මූලාශ්‍රවල දැක්වෙයි. කුසුමාසන දේවියගේ පුතුන් වන්නේ රාජසූරිය අස්ථාන, උඩුමාලේ අස්ථාන, කුමාරසිංහ අස්ථාන හා විජයපාල අස්ථාන යන පුතුන් සිවු දෙනාය. ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය රැකගැනීම උදෙසා සුවිසල් කාර්යභාරයක් ඉටුකර ඇති මොවුන් දක්ෂ රණකාමීන් විය. 1629 දී වැඩිමහල් පුත් ඌවේ රාජ්‍යත්වයටද, දෙවන පුත් මාතලේ රාජ්‍යත්වයටද පත්වන අතර මොවුන් විවාහ වන්නේ යාපනේ පරරාජසේකරම් යුව රජුන් ගේ දූවරුන් දෙදෙනා සමගය. 1633 දී දඹුලු විහාරයේ නේත්‍රප්‍රතිෂ්ඨාපනයටද එක්වූ බව එම ලේඛනවල දැක්වෙයි.

1628 දී බාලපුත් කුමාරසිංහ අස්ථාන සෙංකඩගල රජු බවට පත්වූ බව බැල්සියස් ලංකා පුරාවෘත්ත නැමැති කෘතියේ දක්වා ඇතත් 1629-1636 කාලයේ ඔහු බදුලු ප්‍රදේශයේ පාලකයා වූ බවට ඓතිහාසික මූලාශ්‍ර ඇත. ඔහු එම ප්‍රදේශයේ සිය බලය තහවුරු කරගත් අතර පෘතුග්‍රීසීන් සහමුලින් පළවා හැරීමට සමත් වූ රණශූරයෙකු බවට පත්විය. 1630 දී පෘතුග්‍රීසි සෙන්පති කොන්ස්තන් තීහු ද සා ඇතුලු ඔහුගේ හමුදාව සහමුලින් සමූල ඝාතනය කොට බදුල්ල රැක ගැනීමේ ගෞරවය ඔහුට ඓතිහාසිකව ලැබී ඇත.



පළමුවන විමලධර්ම සූරිය රජු

කුසුමාසන දේවිය කතෝලික උරුමකමකට හැඩ ගැසුවද දෝන කතරිනා නමින් බෞතීස්ම වුවද බෞද්ධ පුනර්ජීවනය උදෙසා ඇය මහත් කැපවීමෙන් වැඩ කළාය. මහනුවර දළදා මාලිගය ගොඩ නැගීම දළදා වහන්සේ දෙල්ගොමුවේ සිට මහනුවරට වැඩම කරවීම අදද දළදා සමිඳුන් වැඩ සිටින මැණික් ඔබ්බන ලද වටිනා අලංකාර රත්‍රං කරඬුව යටිනුවර විදියේ රන්කරුවෙකු මගින් නිර්මාණය කරන ලද්දේ ඇය විසිනි.

ක්‍රි.ව. 1604 සැප්තැම්බර් 05 වන දින පළමුවන විමලධර්මසූරිය රජු මිය යයි. වැන්දඹුවක් වූ කුසුමාසන දේවිය සතුව තිබූ සිහසුනේ උරුමයත් ඇය සතුව තිබූ අගනා රූපසම්පත්තියත් හේතුවෙන් ඇයට වැඩිකල් වැන්දඹුවක ලෙස විසීමට ඉඩක් නොලැබුණි. උඩරට ප්‍රබල අදිකාරම්වරු දෙදෙනෙකු සහ ප්‍රාදේශීය කුමාරයෙකුද ඇය හා විවාහ වීමට දැඩි උත්සාහයක් දැරුවද විමලධර්ම සූරිය රජුගේ ඥාති සොහොයුරෙකු වූ සෙනරත් ඇය හා විවාහ වී සෙනරත් රජු බවට පත්වෙයි.

කුසුමාසන දේවියගේ දුක්ඛිත ජීවිතයේ දෙවන පරිච්ඡේදය ආරම්භවන්නේ සෙනරත් රජු හා විවාහ වීමෙන් අනතුරුවය. සෙනරත් රජුට දාව දරුවන් තිදෙනෙකු ඇය ලබන්නීය. ඇට පළමුවෙන් විමලධර්ම සූරිය රජුට දාව ලැබූ පළමු දරුවා වූ රාජසූරිය අස්ථාන කුමරු ලග්ගල රණමුරු ඔයේ දිය කෙලීයේදී සෙනරත් රජු අනින් දියේ ගිල්වා මරා දමනු ලද බව වාර්තා වෙයි.

**කුසුමාසන දේවියගේ දුක්ඛිත ජීවිතයේ දෙවන පරිච්ඡේදය ආරම්භවන්නේ සෙනරත් රජු හා විවාහ වීමෙන් අනතුරුවය. සෙනරත් රජුට දාව දරුවන් තිදෙනෙකු ඇය ලබන්නීය. ඇට පළමුවෙන් විමලධර්ම සූරිය රජුට දාව ලැබූ පළමු දරුවා වූ රාජසූරිය අස්ථාන කුමරු ලග්ගල රණමුරු ඔයේ දිය කෙලීයේදී සෙනරත් රජු අනින් දියේ ගිල්වා මරා දමනු ලද බව වාර්තා වෙයි.**

අනතුරුව සෙනරත් රජු සිය රාජ්‍යත්වය පවරා දීමේදී ඔහුගේ පුතු වූ දේවරාජසිංහට සෙංකඩගල පවරා දීම ගැන ඇය රජු සමග උරණ විය. විය යුතුව තිබුණේ විමලධර්මසූරිය රජුට දාව උපන් දෙවන දරුවාට එය පැවරීම. එපමණක්ද නොව සෙනරත් රජු විමලධර්මසූරිය රජුට දාව කුසුමාසන දේවිය බිහිකළ දියණිය ද කෙළසීය. අතිශ්‍ය කළ කිරුණු ඇය 1610 දී රජවාසලින් නික්මිනි. ඉන්පසු ඇය ජීවත් වූයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වැලිමන්නාතොට තිබූ මාලිගාවකය. ඇය එනවිට වැඩිමල් පුතුගේ අලු බඳුනද රැගෙන ආ බව කියයි. ඇය මිය යන තෙක්ම එහි වාසය කළ බවත් සඳහන්ය.

ඇය මිය යන විට ඇය හිතෙෂීව සිටි කුරුවිට රාළගෙන් ඉල්ලීමක් කර තිබුණි. එනම් සමාදානයේ සැතපීම සඳහා දේහය මිහිදන් කරන ලෙසත් අලුබඳුන හා බයිබලයත් රෝස පබලු ජපමාලයත් තමා අසල තබන ලෙසත්ය. ඇගේ දේහය මිහිදන් කරන ලද්දේ කෑගල්ලේ වැලිමන්නාතොට රොක්හිල්වතුයාය අසල භූමියේය. අද එය පුරාවිද්‍යා රක්ෂිතයකි.

තම වැඩිමල් පුත් ඝාතනය නිසා තම දියණිය අඹුකමට ගත් නිසාත් දේවිය අතිශ්‍ය කම්පිත කළකිරුණු දිවියක් ගෙවූවාය. එපමණක ඇගේ දෙවන දියණියද වියපත් සෙනරත් රජු අඹුකමට තබා ගත්තේ රාජ්‍යත්වය තහවුරුකර ගැනීම සඳහාය. ඇගේ මරණින් පසු ඇගේ නැගනියද මෙම මහලු රජු බිසෝ තනතුරට පත් කරගත් බව කියවෙයි.

ඇය දෝන කතරිනා ලෙසින් බෞතීස්ම ලැබ කතෝලික දිවියකට හුරු පුරුදු වුවුත් ඇය කිසි විටක සිංහල බෞද්ධ කමට නිගරුවක් නොකළාය. ඇය යම් විටක පෘතුග්‍රීසි කාරයෙකු සරණ කර ගත්තානම් සිංහල රාජ්‍යත්වය හා රාජාවලිය ද සමග ලාංකීය අඛණ්ඩ ඉතිහාසය වෙනත් දිසාවකට හැරී සිංහල බෞද්ධ පදනමද සුණු විසුණු වී යනු නොවනුමානය.

අතිශ්‍ය සුන්දර සුපසන් දැකුම්කලු නිහතමානී චාම් රූප ස්වභාවය ඇය මිය යනතෙක්ම නොසැලී තිබූ බවට ඓතිහාසික ලේඛන සාක්ෂි දරයි. සිංහල රාජාවලියේ කඳුලු බිංදුව වූ ඇය සියලු දුක්ඛ දෝමනස්සයන් ඇගේ ඉරණම වුවද ඇය අතින් රටටවත් සිංහල බෞද්ධ ජනයාටවත් හානියක් නොවූවාය. ඇගේ අඛණ්ඩ තාවර දිවි පැවැත්මට සිංහල ජාතියේ උපහාරය හිමිවිය යුතුය.

# හෙණ ගහන සොහොන

එකදාස් නවසිය විසි ගනන් වල යාල ප්‍රදේශය බාරව සිටි ජේ.පී. ඉරේෂස් නමැති බ්‍රිතාන්‍ය ජාතික සුදු නිලධාරියා දක්ෂ දඩයක්කරුවෙකු විය. ඔහුගේ විනෝදාංශය වූයේ අලින් දඩයන් කිරීමයි. යාල වනෝද්‍යානයේ දහස් ගානක් අලි ඇතුන් මොහුගේ වෙඩි පහර කා මැරී වැටුණි.




වෙඩි පහර කන අලියා කුංචනාද දී ඇද වැටෙනු දකින ඔහු අපමණ සතුටක් ලබයි. දැවැන්ත හස්තීන් එසේ මැරෙනු දැකීම ඉරේෂස් ගේ සතුටයි.

දිනක් ඔහුගේ ඉලක්කය වැරදිනි. හස්තියා ඉරේෂස් ගේ තුවක්කුවට පෙර ක්‍රියාත්මක විය. අලියා ගේ දැවැන්ත පහරින් ඉරේෂස් මැරී වැටුණි. අලියාගේ මරණය ඉදිරියේ සතුටු වූ ඉරේෂස් සහ ඔහුගේ මිතුරන්ට ඉරේෂස් ගේ මරණය අතිශ්‍ය දුකක් බවට පත්විය.

ඉරේෂස් ගේ මිතුරන් එම ස්ථානයේ ඔහු සිහිවීම පිණිස සොහොනක් ඉදි කළේය. යාල වනෝද්‍යානයේ රමණීය ගල්තලාවක ඉදිකර ඇති එම සොහොනේ මෙසේ ලියා ඇත.

දීගල්ගේ ප්‍රදේශයේ නිර්මාතෘ හා බ්‍රිතාන්‍ය ජාතික ශූර දඩයක්කරුවෙකු වූ ජේ.පී. ඉරේෂස් මහතා සිහිවීම පිණිසයි. උපත 1877 අප්‍රේල් 03 වනදා විපත 1923 නොවැම්බර් 12 වනදා ඔහු ගේ මිතුරන් විසින් මෙම සිහිවටනය ඉදිකරන ලදී. ඔහු සමාදානයේ සැතපේවා.

මෙම සොහොනේ අයිතිය තාමත් ඇත්තේ බ්‍රිතාන්‍ය රජයටයි. මේ පිළිබඳව නිතරම වනජීවී දෙපාර්තමේන්තුව විසින් බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට වාර්තා කළ යුතුය. මුලදී අඩි 40 ක් තරම් වූ මෙම සොහොනේ දැන් උස අඩි 20 කි. එයට හේතුව මෙම සොහොන් කොතට නිතර නිතර හෙණ වැදීමයි.



මෙම සොහොනට හෙණ වැදී කැඩුණු පසු වනජීවී දෙපාර්තමේන්තුව වෙනුවෙන් එම ප්‍රදේශයේ අඩවි වන නිලධාරියා විසින් වාර්තාවක් යවයි. ඉන් පසු බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය එය පරීක්ෂාකර අලුත්වැඩියා කටයුතු සිදු කරයි. මේ හෙණ වැදීම නිසාම එහි උස දැන් අඩි 20 දක්වා අඩුකොට ඇත.

මෙම ප්‍රදේශවාසීන් කියන්නේ ඔහු අතින් මිය ගිය අලින් ගේ ආත්මයන් එම සොහොන් කොතිනුත් පලිගන්නා බවයි.






වෛද්‍ය වයි. කේ. ලක්මාල් ශ්‍රී සුගතදාස
071 4257711

# ආහාර අනුභවය හා නිරෝගිකම

**වර්තමාන සමාජය විවිධ රස ආහාර සොයා යෑමේ දැඩි ප්‍රවණතාවක් දක්නට ඇත. එයට ප්‍රධාන හේතු දෙකක් ඇත. ඉන් පළමු වැන්න රස තෘෂ්ණාවයි. දෙවැන්න විවිධ වූ ආහාර කරා ජනතාව යොමු කරවීමේ ව්‍යාපාරයයි. මේ දෙකෙන්ම සිදු වන්නේ අනුභව කරන්නාට විපතකි. පංචේන්ද්‍රියන් පිනවීම යනු දුක්ඛිත වූ සංසාර ගමනකට සත්වයා යොමුවීමයි. නිවන යනු මෙම පංචේන්ද්‍රියන් කෙරෙන් ලබා ගන්නා අරමුණු උපාධාන නොකර ගැනීමයි. එය සංසාරික වශයෙන් යහපතකි.**

විවිධ වූ ව්‍යාපාරිකයින්ගේ පෙළඹවීම මතින් විවිධ වූ ආහාරවලට යොමුවීමෙන් නිරෝගිකම අපේ සිරුරෙන් ගිලිහී යෑමත් ආර්ථික පරිහානියත් යන දෙකම මෙලොව වශයෙන් සිදුවෙයි.

මේ වන විට ලංකාවේ 30-35% ක් අතර සංඛ්‍යාවක් දියවැඩියාව නොහොත් මධුමේහය රෝගයට ගොදුරු වී ඇත. එනම් රටේ ජනගහනයෙන් තුනෙන් එකකි. ක්ෂණික ආහාර රසකාරක ෆාම් ඔයිල් තිරිඟු පිටි ආශ්‍රිත ආහාර බහුල වීම හා කෑම වර්ග ජනතාව වැඩි වැඩියෙන් පරිභෝජනය කිරීමට යොමුවීමත් තුළ හෘදරෝග අධි රුධිර පීඩනය දියවැඩියාව පිළිකා අංශභාගය වකුගඩු රෝග ආදී අවධානම් සහිත බෝ නොවන රෝගද බහුලවන්නට වී ඇත. එසේ නම් මේ රෝග හා ආහාර අතර විශේෂ සම්බන්ධයක් ඇති බවට විවාදයක් නැත.

චූන් පාන් කාරයා ගේ නලාව හඩ තලන විටත් ප්‍රධාන මාර්ග අසල කොත්තු, පරාටා, ප්‍රයිඩ් රයිස්, චිකන්, බර්ගර් ආදී විවිධ වූ විදේශීය කෑම වර්ග බෝඩ් ගසා නිෂ්පාදනය කරන විටත් කටට කෙළ උණා අනතුරුව ඒවා බඩට යන්නේ නිරායාශයෙනි. එය මුදල් උපයන ව්‍යාපාරිකයාගේ දක්ෂතාවත් අනුභව කරන්නා ගේ පෙරේතකම හා මෝඩකමත් අතර ප්‍රශ්නයකි.

මේ අතර රෝගයක් නොවුණත් නිරෝගි කම ඉතා ඉක්මනින් සිරුරෙන් ඉවත්වීමට බලපාන ස්ථූල භාවය මේ වන විට ළමා පරපුරට මහත් තර්ජනයක් වී ඇත. විශේෂයෙන් මෝඩ දෙමව්පියන් විසින් ළමුන් සතුටු කිරීමේ අරමුන් විවිධ වූ ආහාර වර්ග ගෙනවිත් දී එක් පැත්තකින් දරුවන්ගේ සෞඛ්‍යයට බලපෑම් කරන අතර අනෙක් පැත්තෙන් දරුවන් අවිධිමත් ආහාර ගැනීමකට හුරු කරති. ළමුන් බරින් වැඩිවීමත් බෙල්ල පපුව ආශ්‍රිතවත් බෙල්ල වටා කලු දාරයක් ඇති වීමත් මේ අවිධිමත් ආහාර රටාව පෙන්නුම් කරන කදිම ලක්ෂණයක් වගේම ඉක්මන් රෝගී තත්ත්වයන්ගේ ලක්ෂණයි. විශේෂයෙන් පූර්ව දියවැඩියා ලක්ෂණයකි.

අප ආහාරයට ගන්නා එක් බිස්කට් එකක සීනි මේස හැන්දක් ඇතුළත්ය. බිස්කට් පහක් ආහාරයට ගැනීම යනු සීනි ග්‍රෑම් 25 ක් ශරීර ගත වෙයි. එය වසරකට කිලෝ පහකින් බර වැඩි කිරීමට හේතුවෙයි.

සමහරු හිතන්නේ සීනි ගුලියක් හා පිටි ගුලියක් සමබල ආහාර වේලක් වශයෙනි. පිටි යනු තවත් සීනි ප්‍රමාණයකි. ලාංකීය ජන සමාජයේ ආහාර රටාව වෙනස්වීමේ ස්වභාවය අප කාටත් තේරුම් ගැනීම අපහසු නොවේ. එම ආහාර රටාව වෙනස්වීමත් සමඟ ශරීරයේ පැවැත්මද වෙනස් වීම ස්වාභාවිකය. අපේ ආහාර රටාව ක්‍රමිකව වෙනස් වූවක් නොවේ. එය වේගයෙන් සිදුවූ වෙනසකි. මෙය තවත් හොඳට කැපී පෙනෙන්නේ ග්‍රාමීය මට්ටමට ගිය විට නිරෝගී තත්ත්වය වැඩි ජනතාවක් හමුවෙයි. ඒ ඔවුන්ගේ ආහාර රටාව තාමත් සුලු වශයෙන් හෝ සාමප්‍රදායික මට්ටමක පැවතීමය.

සාම්ප්‍රදායික ආහාර වේලේ අඩංගු වූයේ පරිසරයෙන් සොයා ගන්නා ස්වාභාවික අමුද්‍රව්‍යය.





එහෙත් නාගරික පරිසරයේ වැඩිපුර ඇත්තේත් ගිජුකමින් යුතුව අනුභව කරන්නේත් නාගරික පරිසරයේ අපිරිසිදුව නිපදවන කෘතිම ආහාරයි. ඒ නිසාම ඒවා භාවිතා කරන පිරිස් ඒ ඒ රෝග වලට ගොදුරු වෙයි.

විවිධ වූ මානසික ආතතියන්ට ලක්වූවන් පැණිරස හා කෘතිම ආහාර අනුභවයට පෙළඹී සිටින බව ද සොයා ගෙන ඇත. දියවැඩියාව යනු සෙම් රෝගයකි. සෙම් කිපීමෙන් හට ගන්නා රෝගයකි. සීනි හා පැණි රස සෙම වැඩි කරවන ආහාරය. දියවැඩියා රෝගීන් හෝ පූර්ව දියවැඩියා ලක්ෂණ ඇති අය හෝ පැණි රස හා අධික පිෂ්ඨය සහිත ආහාර ගැනීම නුසුදුසු බව කියන්නේ එබැවිනි. ඔවුන් ගත යුත්තේ අම්ල හා ලවන බහුල ආහාරය. තිත්ත රස ආහාර අනුභවය දියවැඩියා පාලනයට හේතුවෙයි. දියවැඩියාව රෝගය තදින් ඇත්නම් අම්ල හා ලවණ ආහාරද නුසුදුසුය. ඔවුන්ට වඩාත් සුදුසු තිත්ත ආහාරය.

කොතල හිඹුටු, වල් කොත්තමල්ලි, කරවිල කොහොඹ තෙබු අත්තික්කා වැනි දේ බහුලව දිය යුතුය. රෝග ඇතිවීමෙන් පසු සුවකර ගැනීම පහසු කටයුත්තක් නොවේ. මධුමේහය වැනි රෝගී තත්ත්වයක් ඇතිවීම අතිශය භයානකය. එය මාරාන්තික තත්ත්වයට පවා යා හැකිය. සුව කිරීම 1% ක් තරම්වත් නැත. බොහෝ විට සිදු වන්නේ එය පාලනය කිරීමයි.

එහෙත් එය ද කළ නොහැකි තත්ත්වයට පත්වන අවස්ථාවක් ද ඇත.

මස්බැද්ද, කුරුඳු ආදිය නිතර භාවිතා කිරීමෙන් දියවැඩියාව මර්ධනය කළ හැකිවා මෙන්ම එයට ගොදුරු වීමද වලක්වා ගත හැක.

කොහොඹ කොළ, කරවිල, කොවක්කා ශරීරයේ සීනි මට්ටම පාලනය කළ හැකි අතර ආහාර ගැනීමත් සමගම ශරීරයේ සීනි මට්ටම ක්ෂණිකව ඉහළ යෑමේ අවධානම පාලනය කරන ඖෂධයකි.

කහ කුඩු, නෙල්ලි කුඩු, උළුහාල් කුඩු, මේවා තේ හැඳි 1/2 බැගින් ගෙන වතුර වීදුරු භාගයක දියකර හිස්බඩ පානය කිරීම දියවැඩියාව පාලනයට සුදුසු ප්‍රතිකර්මයකි. කරවිල ඇට හා පොත්ත ඉවත් කර මිරිකා ලබා ගන්නා යුෂ හිස්බඩ පානය කරන්න.

වතුර ලීටරයක් හොඳින් රත්කර මද ගින්නේ තබා කුරුඳු තේ හැඳි තුනක් එයට එක්කර දවස පුරා ටික ටික පානය කරන්න. උළුහාල් ඇට මේස හැන්දකට ජලය මිලි ලීටර් 250 ට එක්කර පසුදා උදෑසන වනතුරු තබා උදෑසන බොන්න. මෙය දිනපතා කරන්න.

උළුහාල් ග්‍රෑම් 100 ක් හා කහ ග්‍රෑම් 25 ක් කිරි වීදුරුවකට දමා පානය කරන්න.

විවිධ වූ ආහාරයන්ට ලොල් නොවී දිනපතා නියමිත වේලාවට පමණක් පමණ දැන ආහාර අනුභව කිරීමෙන් විවිධ රෝග රැසකින් අත්මිදිය හැක. අපගේ පෙර තිබූ ආහාර රටාව ට යොමු විය හැකි නම් මෙම රෝග වලින් බොහෝ දුරට මිදිය හැක. කෙසේ වෙතත් දැනට නිරෝ ගීව සිටින ජනතාව තේරුම් ගත යුත්තේ අද අපි භාවිතා කරන ආහාර රටාව නිසා ඉතා ඉක්මනින් අප රෝගීන් බවට පත් කරන බවයි.

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
## சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
# Ceylon Shipping Lines Ltd

**ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.**

### ඕස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
சி. எஸ். எல். அவுஸ்திரேலியா
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
+61397929877/0061 396023966
+61397924655
cargo@skyway.com.au/www.skyway.com.av

### ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
ஜூரியா இன்டர்நெஷனல்
**Juria International**
+81283205383
+81283205384
Mobile - 0081-(90) 31027600
tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

සර්ෆායර් ඉන්ටර්නැෂනල්
ஷபீர் இன்டர்நெஷனல்
**Sapphire Int.**
Sakae Cho 1 - 15 - 29
Higashimurayanna City, Tokyo - Japan.
042 - 936 - 6517

### සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிட்.
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
+6563966614 / +6563966615
+6563966621
sales@ms5.com.sg / mifras@ms5.com.sg

### දෝහා - කටාර් / தோஹா - கட்டார் Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
+974 40 414141
+974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
cmb@lanslogistics.com

ගල්ෆ් පැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் செர்வீசஸ் கம்பனி
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
+974 44869723
+974 77885503 / +974 77883866
gulffalconcargoqatar@gmail.com

ටයිටැනික් වේස් කොමර්ෂියල් සර්විස්
**Titanic Ways Commercial Service**
8279 King Fahad Road, Al Faiha District
P.O. Box : 9184
Jeddah 22241 - 2158 - Kingdom of
Saudi Arabia
+966126447050 +966 126447050
Mobile: +966556258377 / +94 777901274
mkt@titanicways.com

### මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
603-40421896 / +966 539222031
00966 532480407
jay_langka@yahoo.com
jayalankacargo@gmail.com

### කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
0096522419095, 0096522457315
0096522419098
falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
+9652495858/+9652470862/+96522495898
info@unitedexpresslogistics.com

### ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. / Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
Fax: +971 4 320 71 71
info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
+971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
+971 42895750
hirumooncargo@gmail.com

ඕෂන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
00971-04-2640054
Mobile - 00971-0555 491 987
oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
+971 6 7480522
lakbimacargo@gmail.com

### බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
+973 35939343
+973 17 811707
colombosuppliersbhn@gmail.com

### සවුදි අරාබිය / சவுதி அரேபியா Saudi Arabia

#### Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al
Gahathani Trading Est) Jeddah, K.S.A.
0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
imthiyaz85360@yahoo.ca

#### දමාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
+966550952031

#### රියාද් - ரியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
+966555892754
+966532083640
abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
2442032/4793845/0508273719
4793845 / 00966 - 583090555
fameruhcmb@gmail.com

ජී එම් අයි ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ්
**G M I International Pvt Ltd.**
German
Mobile: +94 777150997
+94 112890099
+94 112890099
indika@gmi.lk

### ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
0041-796656563 / 0041- 443025838
mcscargo@swissmail.com

### කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
+9056739873
+9056739905
cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

### එංගලන්තය / இங்கிலாந்து United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
02086680252
info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
**Mass Global Shipping**
044(0)208 4221232
208 8644244
info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
02086489092 / 07908787627
info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
02084596633 / 0794743535
ajantha.atlasshipping@gmail.com

### ඇමරිකාව /அமெரிக்கா /America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
1888 232 1952
nishan@colomboexpress.com
www.colomboexpress.com

# Ceylon Shipping Lines Ltd



450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617







Ceylon Shipping Lines Ltd.

SLSI SYSTEM CERTIFIED ISO 9001

MGMT. SYS. RvA C 155

PATA Pacific Asia Travel Association

IATA

TAASL

***Serving with Excellence***

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing